# වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# Annual Report
# 2019




ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව
இலங்கை அரச பொறியியற் கூட்டுத்தாபனம்
**STATE ENGINEERING CORPORATION OF SRI LANKA**

www.secsl.lk

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව

இலங்கை அரச பொறியியற் கூட்டுத்தாபனம்

STATE ENGINEERING CORPORATION OF SRI LANKA

# 2019

# වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# Annual Report

SEC

# පටුන


| | | |
|---|---|---|
| 1. | ආයතනික පාලන වාර්තාව | 1 |
| 2. | ජාතිය ගොඩනැගීමේ නිර්මාණකරුවෝ | 3 |
| 3. | අධ්‍යක්ෂ මණ්ඩලය සහ ආයතනික කළමනාකාරීත්වය | 5 - 8 |
| 4. | සභාපතිගේ සමාලෝචනය | 9 |
| 5. | අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව | 10 |
| 6. | මූල්‍ය හා මෙහෙයුම් විශ්ලේෂණ වාර්තාව | 11 - 15 |
| 7. | විගණන කමිටු වාර්තාව - 2019 | 17 - 18 |
| 8. | විගණන වාර්තාව | 19 - 28 |
| 9. | මූල්‍ය ප්‍රකාශන | 29 - 67 |
| 10. | මූල්‍ය වර්ෂ පිරිවැටුම - දළ ලාභය, ශුද්ධ ලාභය, ස්ථාවර වත්කම්, ජංගම වත්කම් හා වගකීම් | 68 - 70 |
| 11. | කාණ්ඩ තොරතුරු, මානව සම්පත් හා පාලන අංශය අභ්‍යන්තර විගණන අංශය | 71 - 91 |

# ආයතනික පාලන වාර්තාව

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේහි විධිවිධාන යටතේ ස්ථාපිත රාජ්‍ය සංස්ථාවකි. සංස්ථාවේ ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය අංක 130, ඩබ්ලිව්.ඒ.ඩී. රාමනායක මාවත, කොළඹ 02 හි පිහිටා ඇත. ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ මූල්‍ය වර්ෂය 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන පරිදි එහි මූල්‍ය ප්‍රකාශ සමන්විත වන අතර එහි ව්‍යාපෘතියක් වන ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයද සමඟ දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වන පොදු මූල්‍ය වර්ෂයක් වශයෙන් කටයුතු කර ඇත.

රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය මූලික වශයෙන් ඉදිකිරීම්, ගොඩනැගිලි උපාංග නිෂ්පාදනය, යාන්ත්‍රික හා විදුලි කටයුතු ඉංජිනේරුමය කාර්යයන් සහ, උපදේශන කටයුතු වශයෙන් රජය විසින් ප්‍රකාශිත 2008.03.28 දිනැති ගැසට් නිවේදනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි පහත සඳහන් ක්‍රියාකාරකම් වශයෙන් හඳුනාගෙන ඇත.

I. ශ්‍රී ලංකාවේ හෝ විදේශයකදී ඕනෑම පාර්ශවයකට අයත් ගොඩනැගිලි, සිවිල් ඉංජිනේරු සහ වෙනත් ඉංජිනේරු ව්‍යාපෘති තනිවම හෝ වෙනත් පාර්ශවයක් සමග හවුල් වී විමර්ශනය කිරීම, සැළසුම් කිරීම, නිර්මාණය කිරීම, ඉදිකිරීම සහ එවැනි හවුල් ව්‍යාපාර වල ප්‍රාග්ධන කොටස් අත්පත් කර ගැනීම හෝ හිමිකම් දැරීම.

II. ශ්‍රී ලංකාවේ දී හෝ විදේශයකදී තනි වශයෙන් හෝ දේශීය හෝ විදේශීය සමාගමක හවුල්කරුවෙකු ලෙස හිමිකම් දරමින් ඕනෑම පාර්ශවයකට සියලුම ඉංජිනේරු ක්ෂේත්‍රයන්ට අදාල වන පරිදි උපදේශක සහ ව්‍යාපෘති කළමණාකරණ සේවා සැපයීම.

III. තනි වශයෙන් හෝ දේශීය විදේශීය සමාගමක හවුල්කරුවෙකු ලෙස දේපළ සංවර්ධනය කිරීම සහ එවැනි සමාගමක ප්‍රාග්ධන කොටස් දැරීම හෝ අත්පත් කර ගැනීම.

IV. ශ්‍රී ලංකාවේ දී හෝ විදේශයකදී නිමි මිශ්‍ර කොන්ක්‍රීට්, සවිමත් කළ කොන්ක්‍රීට් සහ පෙරනිමි කොන්ක්‍රීට් යොදා කරනු ලබන භාණ්ඩ නිෂ්පාදන කාර්යයන් සහ ඒවායේ අලෙවිය.

V. ඉංජිනේරුමය ව්‍යාපෘති / ක්‍රියාකාරකම් සඳහා ඉදිකිරීම් ද්‍රව්‍ය යන්ත්‍රෝපකරණ සහ උපකරණ නිෂ්පාදනය, අලෙවිය, ආනයනය සහ අපනයනය.

VI. ඉහත අංක (i), (ii), (iii), (iv) සහ (v)දැක්වෙන අරමුණු සඳහා අවශ්‍ය වන ඉංජිනේරු සහ කාර්මික ශිල්පීන් පුහුණු කිරීම.

VII. ඉහත අංක (i), (ii), (iii) සහ (iv) හි දැක්වෙන අරමුණු සඳහා උපයෝගී කරගනු ලබන ඉදිකිරීම් ද්‍රව්‍ය, විධික්‍රම සහ කාර්මික ශිල්පීය ක්‍රම පිළිබඳ පර්යේෂණාත්මක කාර්යයන් ඉටු කිරීම.

ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව යටතේ ක්‍රියාත්මක වන විශේෂ ඒකකයක් වන අතර එය 2011 වසරේ අමාත්‍ය මණ්ඩල තීරණයෙන් සංස්ථාව වෙත පවරන ලද අතර, දිවයිනේ ග්‍රාමීය ප්‍රදේශ වල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට සහාය වීමේ අරමුණින් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව යටතේ

වෙනම ඒකකයක් ලෙස ක්‍රියාත්මක වෙමින් බර යන්ත්‍ර කුලියට සැපයීම ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් හා බැඳි ව්‍යාපාරයන්හි නිරත වේ.

# ජාතිය ගොඩනැගීමේ නිර්මාණකරුවෝ

01

## දැක්ම

නිර්මාණ කාර්යයෙහි ප්‍රමුඛයා බවට පත්වීම.

02

## මෙහෙවර

සමෘද්ධිමත් ව්‍යාපාරයක් තුළ සේවාදායක සන්තුෂ්ටිය පවත්වා ගනිමින්, තරඟකාරී සහ උද්යෝගිමත් ශ්‍රම බලකායක සහභාගිත්වයෙන් යුතුව පර්යේෂණය සහ සංවර්ධනය තුළින් සහාය වන අතිවිශිෂ්ඨ උපදේශක සේවා, ඉදිකිරීම් නිෂ්පාදන සහ ව්‍යාපෘති කළමනාකරණ සේවා තුළින් නිර්මාණශීලී සහ ඒකාබද්ධ ඉංජිනේරුමය විසඳුම් සම්පාදකයා ලෙස ජාතික සංවර්ධනයට දායකත්වය සැලසීම.

03

## අපගේ හර වටිනාකම්

- සේවාදායක සන්තුෂ්ටිය
- ඒකාබද්ධතාවය
- සමාජ මෙහෙවර
- සේවක සන්තුෂ්ටිය
- සුරක්ෂිතභාවය
- ගුණාත්මකභාවය

04

## අපගේ ඉලක්කයන්

- තාක්ෂණික ප්‍රමිතීන්ගේ සහ වෘත්තිමය භාවයේ ඉහළම මට්ටම අත්කර ගැනීම.
- වාණිජමය ඉලක්ක සහිත, මුල්‍ය වශයෙන් ස්ථායී, ස්වයංපෝෂිත, රාජ්‍ය ව්‍යවසායක් බවට පත්වීම.
- සංස්ථාවේ ව්‍යාපාර කටයුතු විවිධාංගීකරණය කිරීම.
- දේශීය තාක්ෂණය සහ දේශීය අමුද්‍රව්‍ය භාවිතය සංවර්ධනය කර ප්‍රවර්ධනය කිරීම.
- ජාතික සංවර්ධන වැඩසටහන් වල ප්‍රමුඛ සහකරුවා බවට පත්වීම.
- සංස්ථාවේ කළමනාකාරිත්වය සහ මානව සම්පත් වැඩි දියුණු කිරීම.

# අධ්‍යක්ෂ මණ්ඩලය - 2019



**ආචාර්යය ටී.ඒ.ජී.ගුණසේකර මහතා**
සභාපති
(2016.09.08 සිට 2019 නොවැම්බර් දක්වා)



**පී.ජේ.එම්.පැල්පොල මහතා**
උප සභාපති
(2015.02.09 සිට 2019 නොවැම්බර් දක්වා)



**සරත් ජී.ජයතිලක මහතා**
ක්‍රියාකාරී අධ්‍යක්ෂක
(2015.02.09 සිට 2019 දෙසැම්බර් දක්වා)



**නිලූ දිල්හාර විජේදාස**
විධායක අධ්‍යක්ෂක
(2019.01.10 සිට 2019 නොවැම්බර් දක්වා)



**පාලිත වල්පොල මහතා**
අධ්‍යක්ෂක
(2015.02.10 සිට 2019 නොවැම්බර් දක්වා)

**බී. අයිරාංගනී මිය**
අධ්‍යක්ෂක (අමාත්‍යාංශ නියෝජිත)
(2017.08.28 සිට 2019 දෙසැම්බර් දක්වා)



**බී.කේ. බාලසූරිය මහතා**
අධ්‍යක්ෂක (භාණ්ඩාගාර නියෝජිත)
2018 ඔක්තෝබර් සිට 2019 නොවැම්බර් දක්වා

---



**අයි. වික්‍රමනායක ඇලෙක්සැන්ඩර් මහත්මිය**
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්
2015.02.09 සිට 2019 නොවැම්බර් දක්වා

**මර්ලසා එබෙන්සර් මහත්මිය**
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්
2019 ජූනි සිට 2019 නොවැම්බර් 07 දක්වා



**අයි.පී. සිවරත්නම් මිය**
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්
2019 නොවැම්බර් 08 සිට

## ආයතනික කළමනාකාරිත්වය

| | | |
|---|---|---|
| ඩී.ටී. රාජසේකරන් මහතා | - | සාමාන්‍යාධිකාරි |
| පී.ඩී. කරවිට මහත්මිය | - | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ඉදිකිරීම්) |
| කේ.ඊ.එච්.ටී. රණසිංහ මහතා | - | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (උපදේශක) |
| එම්.එච්. සේනාවීර මහතා | - | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මූල්‍ය) |
| එච්.ඒ.එස්.ටී. හතුරුසිංහ මහතා | - | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මානව සම්පත් හා පාලන) |
| ඒ.පී. තෙන්නකෝන් මහතා | - | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ඉදිකිරීම් උපාංග) |
| ඒ.පී.කේ. මනම්පේරි මහතා | - | වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (යාන්ත්‍රික හා විදුලි) |
| කේ. ඒ. එස්. ශාන්ත මහතා | - | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි |

## ජ්‍යෙෂ්ඨ කළමනාකරණය

| | | |
|---|---|---|
| පී.එම්.ඒ. කරුණාසිංහ මහතා | - | කළමනාකාර (මූල්‍ය) |
| ඒ.පී.කේ. මනම්පේරි මහතා | - | කළමනාකාර (ඉදිකිරීම්) |
| ටී. විජයකුමාර් මහතා | - | කළමනාකාර (ඉදිකිරීම්) |
| වී. මුරුගේසු මහතා | - | කළමනාකාර (ඉදිකිරීම්) |
| එම්.ඊ.සී. පින්තු මහතා | - | කළමනාකාර (ඉදිකිරීම්) |
| සී.ඒ.එස්. හෙට්ටිආරච්චි මහතා | - | කළමනාකාර (ඉදිකිරීම් උපාංග) |
| එල්.එස්.ටී. ලියනගේ මෙනවිය | - | කළමනාකාර (මානව සම්පත් / පුහුණු සහ සංවර්ධන) |
| එන්.ජේ. ජයකොඩි මහත්මිය | - | ප්‍රධාන ඉංජිනේරු (සැලසුම්) |
| ඩී.එන්.ඒ. ගලප්පත්ති මහතා | - | ප්‍රධාන ප්‍රමාණ සමීක්ෂක |
| එන්.ඒ.බී.ආර්. අල්විස් මෙනවිය | - | ප්‍රධාන වාස්තු විද්‍යාඥ |
| එම්.එස්.සී. පෙරේරා මහතා | - | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| ආර්.පී.පී. වික්‍රමසිංහ මහතා | - | ප්‍රධාන ආරක්ෂක නිලධාරි |
| පී.එස්.ඩී. රාජනී මහත්මිය | - | ප්‍රධාන ඉංජිනේරු (කොන්ත්‍රාත් හා සැලසුම්) |
| ඒ.එම්.එස්.ටී.බී. අලහකෝන් මහතා | - | වැඩ බලන කළමනාකාර (ඉදිකිරීම් ) |
| ඒ.ආර්.එල්. විජේබණ්ඩාර මහතා | - | වැඩ බලන කළමනාකාර (ඉදිකිරීම් උපාංග) |
| එන්.ජේ. ජයකොඩි මහතා | - | වැඩ බලන කළමනාකාර (තොරතුරු තාක්ෂණ) |
| ටී. බී. ජයලාල් මහතා | - | වැඩ බලන ප්‍රධාන සැපයුම් නිලධාරි |



# සභාපතිගේ සමාලෝචනය

**ආචාර්ය ටී.ඒ.ජී. ගුණසේකර මහතා**

ධූර කාලය 2016.09.08 සිට 2019.11.28 දක්වා)

2019 මූල්‍ය වර්ෂය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථා වාර්ෂික වාර්තාව සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ඉතා සතුටට පත්වන අතර එය මා ලැබූ ගෞරවයක්ද වේ.

පෞද්ගලික අංශයේ තරඟකරුවන් ක්‍රියාකාරීව කටයුතු කරනු ලබන දැඩි තරඟකාරී ඉංජිනේරුමය වෙළෙඳපොල තත්ත්වයන් යටතේ ආයතනික බාධකයන්ට මුහුණ දෙමින්, රාජ්‍ය ව්‍යවසාය පාලනය වන මූල්‍ය හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා ක්‍රියා පටිපාටි සඳහා අනුගත වෙමින් ක්‍රියා කල අතර 2019 වර්ෂය අවසානයේදී අලාභය, ඊට පෙර වර්ෂයේ අලාභය හා සැසඳීමේදී රු.මි 768 අඩුවීමක් වාර්තා කරන ලදී.

ඉදිකිරීම් ක්ෂේත්‍රය තුල ජාතික මට්ටමේ කාර්ය සාධනයන් පිළිබඳ සලකා බැලීමේදී මහා පරිමාණ ව්‍යාපෘති වේගවත් කිරීමත් සමඟ 2019 වසරේදී ඉදිකිරීම් කටයුතු වල එකතු කල අගය, 2018 වසරේදී වාර්තා කල 2.5% ක පහත වැටීමට සාපේක්ෂව 4% ක හිතකර වර්ධනයක් වාර්තා කරන ලදී. එහි හිතකර බලපෑම මත 2018 වර්ෂයේ ලැබූ අලාභය 2019 වර්ෂයේදී 49% කින් අවම කර ගැනීමට හැකි වී ඇත.

තවද, දැයට කිරුළ ව්‍යාපෘතියක් වන අම්පාරේ ශ්‍රවණාගාරය අළුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂය තුලදී සාර්ථකව නිම කිරීමට හැකි වී ඇත.

වර්තමානයේ ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව 2019 - 2024 ව්‍යාපාරික සැලැස්මට අනුගත වෙමින් එම ඉලක්ක ජය ගැනීමට කටයුතු කරමින් පවතී.

අවසාන වශයෙන් මාගේ සෙසු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට සිය වටිනා සහය සහ උපදෙස් සඳහා මාගේ ස්තුතිය පල කරන අතර, 2019 වර්ෂය සංස්ථාවේ සාර්ථකත්වය වෙනුවෙන් නායකත්වය හා කැපවීම භාරගත් සාමාන්‍යාධිකාරිතුමාටත්, ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වයටත් අපගේ විශිෂ්ඨතම වත්කම වන කාර්ය මණ්ඩලයටත් ස්තුතිවන්ත වෙමි.



ආචාර්ය ටී.ඒ.ජී. ගුණසේකර මහතා

සභාපති



# අධ්‍යක්ෂකවරුන්ගේ වාර්ථාව

**නීතිඥ නිශාන් පාලිත වල්පොල මහතා**

අධ්‍යක්ෂක

1958 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1962 වර්ෂයේදී මෙරට කීර්තිමත් ඉංජිනේරුවරයකු වූ ආචාර්ය කුලසිංහ මහතාගේ මුලිකත්වයෙන් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව ආරම්භ විය. වර්ෂ 1948 නිදහසින් පසුව මෙරට ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පැවති පෞද්ගලික ව්‍යවසායක්තවය වෙනුවට රාජ්‍ය ව්‍යවසායකත්වය මත පදනම් වූ රාජ්‍ය ඉදිකිරීම් ක්‍රියාත්මක කිරීම මෙන්ම අධීක්ෂණය හා උපදේශනය යන අරමුණු පෙර දැරි කරගෙන රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව ආරම්භ විය. මෙරට රාජ්‍ය ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා වශයෙන් වර්තමානයේ නිකලැල් සහ අපිරිමිත සේවාවක් ඉෂ්ඨ කරමින් මෙරට ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නිපුණතාවක් ලබාගන්නා ඉංජිනේරුවන් හා ගෘහ නිර්මාණ ශිල්පීන් ඇතුළු ඒ හා සම්බන්ධ සියලු වෘත්තිකයන් සිය ආධුනික කාල සීමාව තුල ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නිපුණතාවය මුවහත් කර ගැනීමට ප්‍රායෝගික මෙන්ම ශිල්පීය දැනුම ලබාදෙන ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා බවට රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව පත්ව ඇත. එමගින් ඉදිකිරීම් ක්ෂේත්‍ර පිලිබඳ නිපුණතාවයක් දක්වන රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශයේ ප්‍රමුඛයන් බිහිකිරීමට හැකි වීම පිලිබඳ ගෞරවනීය ප්‍රණාමය හා ප්‍රශංසාව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට හිමි විය යුතුය.

තවද, 2010 දශකයේ පටන් ඉංජිනේරු සංස්ථාවට අනුබද්ධ කරන ලද ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය හෙවත් නෙමෝ ආයතනය ඉදිකිරීම් ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් සපයන ආයතනයක් ලෙස රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ මෙතෙක් කල් පැමිණි සාර්ථක ගමනට පිටුවහලක් වී ඇත.

තවද, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සේවය කරන සියලුම පුහුණු හා නුපුහුණු කාර්ය මණ්ඩලය කිසිඳු බේදයකින් තොරව ආයතනයේ අභිවෘද්ධිය උදෙසා කරන කැප කිරීම තුලින් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මේ වන විටත් ලබාගෙන ඇති ප්‍රගතිය තවදුරටත් තීව්‍ර කරගෙන මෙරටේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නොනිමෙන දීප්තිමත් පහන් ටැඹ බවට පත් වීමට හැකි වනු බව නොඅනුමානය.



නීතිඥ නිශාන් පාලිත වල්පොල මහතා

**LL.B(Colombo) LLM (wales) UK**

# මූල්‍ය හා මෙහෙයුම් විශ්ලේෂණ වාර්තාව

## පිරිවැටුම හා ලාභය

2019.12.31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂයේදී සංස්ථාව විසින් රු.මි. 3960 ක පිරිවැටුමක් වාර්තා කරන ලදී.




වගුව I (2015 - 2019 සංස්ථාවේ සංසන්දනාත්මක පිරිවැටුම හා ලාභය)

| | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|
| පිරිවැටුම (ශුද්ධ) | 3168 | 2681 | 3623 | 3278 | 3960 |
| දළ ලාභය | (799) | (748) | (839) | (1194) | (660) |
| බදු අඩු කිරීමට පෙර ලාභ/(අලාභය) | (708) | (1040) | (1316) | (1757) | (1179) |

(රු.මිලියන)

| කාණ්ඩය | පිරිවැටුම | | ප්‍රදානය වූ ව්‍යාපෘති |
|---|---|---|---|
| | 2018 | 2019 | 2019 |
| තැනීම් | 1530 | 1944 | 982.49 |
| ඉදිකිරීම් උපාංග | 1086 | 1142 | 652.19 |
| යාන්ත්‍රික හා විදුලි | 108 | 138 | |
| උපදේශක | 172 | 191 | |
| මාර්ග සහ පාලම් | 78 | 7 | |
| යන්ත්‍රෝපකරණ | 302 | 536 | |
| | 3278 | 3960 | |

## තැනීම් කාණ්ඩය

2019 මූල්‍ය වර්ෂය තුළදී තැනීම් කාණ්ඩය රු. මි. 2014 ක පිරිවැටුමක් වාර්තා කරන ලදුව රු.මි. 446 ශුද්ධ අලාභයකට යටත් වු බවත් එය පසුගිය වර්ෂයට සාපේක්ෂව 15% ක අලාභදායි තත්ත්වයට අඩුවීමක් ලෙසත්, එය මෙහෙයුම් අලාභය අඩුවීමේදී 70% වශයෙන්ද දැක්විය හැකිය. මෙවැනි සාධනාත්මක තත්ත්වයකට එළඹීමට වර්ෂයේ පිරිවැටුමෙහි 26% වර්ධනය හේතු විය.

**පිරිවැටුම හා ශුද්ධ මෙහෙයුම් ලාභය / (අලාභය)**




වගුව II - ඉදිකිරිම් කාණ්ඩයේ පිරිවැටුම සහ ශුද්ධ මෙහෙයුම් ලාභය / (අලාභය)

**වර්ෂය තුලදී කාර්යසාධනය ඇගයීමේදී:**

- ප්‍රදානය කරන ලද නව ව්‍යාපෘතිවල වටිනාකම - රු. මි.982.49 ක් වු අතර,
- නිමකළ ව්‍යාපෘතිවල වටිනාකම - රු. මි.960.57 කින්ද,
- ආරම්භ කරන ලද ව්‍යාපෘතිවල වටිනාකම-රු. මි. 1205.20 ක් වශයෙන් විය.

## ඉදිකිරීම් උපාංග කාණ්ඩය

2019 මූල්‍ය වර්ෂය තුළදි රු. මි. 1247 ක පිරිවැටුමක් සහ රු.මි. 245 ශුද්ධ අලාභයක් විඳිනු ලැබීය. කාණ්ඩය විසින් මෙහෙයවනු ලැබූ තැනීම් ආශ්‍රිත ව්‍යාපෘතීන් මගින් පෙර වර්ෂයට සාපේක්ෂව රු. මි. 214 ක හෙවත් 45% ක වර්ධනාත්මක අගය හේතු කොට ගෙන අන් සියළු නිෂ්පාදන අංගන වල ඌණ පිරිවැටුම් තත්ත්වයන් අභිබවා පිරිවැටුමෙහි වර්ධනාත්මක අවස්ථාවට හිමිකම සහ රු මි. 19ක මෙහෙයුම් ලාභයක්ද පවත්වාගන්නා ලදී. එය වර්ෂයේ ඇස්තමේන්තුගත පිරිවැටුමින් 50% කට ලඟාවීමකි.

**පිරිවැටුම හා ශුද්ධ මෙහෙයුම් ලාභය / අලාභය**




වගුව III - ඉදිකිරිම් උපාංග කාණ්ඩයේ පිරිවැටුම සහ ශුද්ධ මෙහෙයුම් ලාභය / (අලාභය)

**වර්ෂය තුලදී කාර්යය සාධනයේදී;**

- ප්‍රදානය කල ව්‍යාපෘති රු. මි. 652.19 ක්ද,
- නිමකළ ව්‍යාපෘතිවල වටිනාකම රු. මි. 496.8 ක්ද වීය.

**යාන්ත්‍රික හා විදුලි කාණ්ඩය**

2019 මූල්‍ය වර්ෂය තුළදි රු. මි. 414.2 ක පිරිවැටුමක් සහ රු.මි. 116 ශුද්ධ අලාභයක් විඳිනු ලැබීය. අපේක්ෂිත ආදායමට සාපේක්ෂව 60% පමණ ඌන ආදායම් තත්ත්වයක් යටතේ වුවද ගොඩනැගිලි පරිශ්‍ර නඩත්තු පහසුකම් සැපයීමේ කාර්යයේ නිරත අංශය මගින් 2018 වර්ෂයේදී පිරිවැටුම රු. මි. 57.9 ක් හා සැසඳීමේ දී රු මි. 71 ක සත්‍ය පිරිවැටුමක් හා ඒ මත මෙහෙයුම් ලාභය රු මි. 28 ක් හෙවත් 40% දළ ලාභ අනුපාතයක් පවත්වා ගනිමින් පෙර වර්ෂයේ අගයට වඩා 24% ක වර්ධනයක් පෙන්වීම එම ක්ෂේත්‍රය තුල අනාගත ව්‍යාපාරික අවස්ථා පිළිබඳ යහපත් විභවයක් පෙන්වයි.

එමෙන්ම පෙර වර්ෂයේ රු. මි. 181 ක අලාභදායි තත්ත්වය 2019 වර්ෂයේදී රු. මි. 116 දක්වා අඩුවීමද සැලකිය යුතුය.

**පිරිවැටුම සහ ශුද්ධ මෙහෙයුම් ලාභය / (අලාභය)**




වගුව IV - යාන්ත්‍රික හා විදුලි කාණ්ඩයේ පිරිවැටුම සහ ශුද්ධ මෙහෙයුම් ලාභය / (අලාභය)

2019 වර්ෂය තුලදී රු. මි 50.8 අගයැති ගොඩගම ප්‍රදේශයේ අභ්‍යන්තර මාර්ග කාපට් අතුරා පිළිසකර වැඩබිම නිම කර කාර්මික වතු කොටස් හිමියන් වෙත භාර දෙන ලද අතර, දිවයිනේ විවිධ ප්‍රදේශයන් ආවරණය වන ප්‍රජා ජල ව්‍යාපෘතීන් 13 ක් නිමකර එම ප්‍රාදේශීය ජනතාවගේ ජල පහසුකම් සැපයීම පිණිස ක්‍රායක වෙත භාර දෙන ලදී.

**උපදේශක කාණ්ඩය**

2019 වර්ෂයේදී උපදේශක කාණ්ඩය එහි ආදායම රු. මි. 193.9 ක් ලෙස වාර්තා කළ අතර ඒ අනුව කාණ්ඩය වසර තුළ රු.මි.140.6 ක් වූ ශුද්ධ අලාභයක් අත්විඳින ලදී.

කාණ්ඩය විසින් වසර තුලදී වාස්තු විද්‍යාත්මක, ව්‍යුහාත්මක, විදුලි, ප්‍රමාණ සමීක්ෂණ, වායු සමීකරණ හා ගිනි ආරක්ෂණ වැනි විශේෂිත ආකාරයේ සේවා ඇතුලත් සමූහ උපදේශාත්මක සේවා සැපයීම ඇතුළු ව්‍යුහාත්මක ඉංජිනේරු සේවා අපේක්ෂිත ව්‍යාපෘති භාරගන්නා ලදී. එමගින් ගොඩනැගිලි සැලසුම් කිරීමේ සිට ලංසු කැඳවීම් ඇතුළු ඉදිකිරීම් අධීක්ෂණය ප්‍රගති සමාලෝචන ආදී කාර්ය සමුදාය ඇතුලත් ව්‍යාපෘතීන්ද තම සේවා කළඹට එකතුකර ගන්නා ලදී.

එසේම වසර තුලදී ආයතනික සමාජ වගකීම් ලෙස ආගමික, අධ්‍යාපනික හා සෞඛ්‍ය යනාදී ක්ෂේත්‍රයන්හි සේවා රැසක් ඉටුකර ඇත.

**පිරිවැටුම හා ශුද්ධ මෙහෙයුම් ලාභය / (අලාභය)**




වගුව V- උපදේශක කාණ්ඩයේ පිරිවැටුම සහ ශුද්ධ මෙහෙයුම් ලාභය / (අලාභය)

**මාර්ග සහ පාලම් අංශය**

මාර්ග හා පාලම් අංශය 2018 වර්ෂය තුලදී රු.මි. 78 ක් ලැබූ ආදායම 2019 වර්ෂයේදී රු.මි. 7.2 ක් දක්වා පසුබෑමකට ලක් වී ඇති අතර ශුද්ධ අලාභය රු. මි. 28 කි.

**පිරිවැටුම හා ශුද්ධ මෙහෙයුම් ලාභය / (අලාභය)**




වගුව VI - මාර්ග හා පාලම් කාණ්ඩයේ පිරිවැටුම සහ ශුද්ධ මෙහෙයුම් ලාභය / (අලාභය)

**ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය**

ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය 2019 වර්ෂයේදී රු.මි. 536 ක ආදායමක් ඉපයූ අතර පෙර වර්ෂය හා සැසඳීමේදී රු. මි. 234 ක වර්ධනයකට ලක් වී ඇති අතර ශුද්ධ අලාභය රු. මි. 202 කි.

**පිරිවැටුම හා ශුද්ධ මෙහෙයුම් ලාභය / (අලාභය)**




වගුව VII - ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ පිරිවැටුම සහ ශුද්ධ මෙහෙයුම් ලාභය / (අලාභය)

### මුදල් ප්‍රවාහය

2019 වර්ෂය තුළ දී රු. මි. 5350 ඒකාබද්ධ මුදල් ප්‍රවාහයක් සියලු ප්‍රභවයන් තුලින් අත්පත් කර ගැනිමට හැකි වී ඇත. ඒ තුල මෙහෙයුම් ක්‍රියාවලියෙන් සහ රාජ්‍ය ප්‍රදාන මෙන්ම හාහිර මුල්‍යනය මගින් ගලා ඒම්ද වීය.




වගුව VIII - මුදල් ප්‍රවාහ

### වත්කම්

2019 වසර තුළ සංස්ථාවේ මුළු වත්කම් 2018 හා සංසන්දනාත්මකව බලන කල රු.මි.1630 කින් වර්ධනය වී ඇත. ඊට සමාන්තරව සංස්ථාවෙහි ජංගම වත්කම් ප්‍රමාණය 2018 වසරේ ගණනය වූ රු.මි.7356 සිට 2019 දී රු. මිලියන 8790 දක්වා ඉහල යාමක් දක්නට ලැබිණ.




(වගුව IX - වත්කම් තත්වය)

(රු.මිලියන)

| | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|
| ජංගම නොවන වත්කම් | 8535 | 8462 | 8946 | 8692 | 8888 |
| ජංගම වත්කම් | 8395 | 8407 | 7350 | 7356 | 8790 |

**වෙනත් ආදායම්**

| | 2015 (රු. 000) | 2016 (රු. 000) | 2017 (රු. 000) | 2018 (රු. 000) | 2019 (රු. 000) |
|---|---|---|---|---|---|
| කුලිය | 12,975 | 10,441 | 9,704 | 10,225 | 9,090 |
| ප්‍රතිපාදනය ඉක්මවූ ප්‍රත්‍යාවර්ත තොග | 1,258 | 1,239 | 45 | 180 | 57 |
| ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම | 397,130 | 222,130 | 147,130 | 113,787 | 450,000 |
| ලියාපදිංචි ගාස්තු ආදායම | 3,477 | 3,350 | 4,883 | 4,787 | 4,076 |
| විවිධ ආදායම් | 11,595 | 7,403 | 13,159 | 9,410 | 3,342 |
| | **426,437** | **244,566** | **174,921** | **138,389** | **466,565** |

2019 වර්ෂය තුලදී ප්‍රවර්තන වියදම් සඳහා වු රාජ්‍ය ප්‍රදාන රු.මි 450 කි. ක්‍රමක්ෂය, වෙනත් ආදායම් මත ගැලපීම හේතු කොටගෙන එහි වටිනාකම පෙර වර්ෂයට වඩා ඉහල අගයක් ගැනීමට හේතු වීය.

# විගණන කමිටු වාර්තාව - 2019

## කමිටු සාමාජිකයින්

**බී.කේ.ආර්. බාලසූරිය (විධායක නොවන)** - කමිටු සභාපති
M.A.(Econ), Bcom (Sp.Hons), CPFA
ප්‍රධාන මූල්‍ය නිළධාරි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

**බී.ජී.අයිරාංගනී (විධායක නොවන)** - කමිටු සාමාජික
Bcom (Special)
ප්‍රධාන ගණකාධිකාරි,
නිවාස, ඉදිකිරීම් හා සමාජ සුබසාධන අමාත්‍යාංශය

**නිලූ විජේදාස (විධායක)** - කමිටු සාමාජික
City & Guide (London), MBA (UK)
විධායක අධ්‍යක්ෂක, ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව,
සභාපති, ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය

## ප්‍රධාන ක්‍රියාකාරකම්

**2019 වර්ෂයේ දී කමිටුව විසින් ක්‍රියාවට නංවන ලද ප්‍රධාන කාර්යයන්**

1. අභ්‍යන්තර විගණන ඒකකයේ විෂයපථය තීරණය කිරීම.
2. වාර්ෂික විගණන සැලැස්ම සහ වැඩසටහන සමාලෝචනය කර අනුමත කිරීම.
3. අභ්‍යන්තර විගණන වාර්තා මත පදනම්ව ගිණුම්කරණය, මූල්‍ය සහ මෙහෙයුම් අංශ ආවරණය වන අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය කර ඇගයීම.
4. අවසාන ගිණුම්, වාර්ෂික වාර්තා නියමිත වේලාවට ඉදිරිපත් කිරීම සහතික කිරීම.
5. භාණ්ඩාගාර චක්‍රලේඛ සහ අනෙකුත් නියෝගවලට අනුකූල වීම පිළිබඳ දැනුවත් කිරීම සහ අවශ්‍යතා ඇති කිරීම.
6. පුද්ගලික සහ පරිපාලනයට අදාළ කරුණු සමාලෝචනය කර තීරණ සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.
7. කාර්ය මණ්ඩලයේ විනය, නාස්තිය සහ දූෂණය තුරන් කිරීම සම්බන්ධ කරුණු සමාලෝචනය කිරීම සහ සංවිධානය, පිරිවැය දැනුවත් කිරීම.
8. අභ්‍යන්තර විගණන වාර්තාව සමාලෝචනය කර පෙන්වා දී ඇති කෙටි පැමිණිලි සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම සහතික කිරීම.
9. අභ්‍යන්තර විගණන වාර්තාව සමාලෝචනය කර හැකි පරිදි නිවැරදි ක්‍රියාමාර්ග ගැනීම.
10. පොදු ව්‍යාපාර පිළිබඳ කමිටුවේ (COPE) නිර්දේශ ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කිරීම.
11. ජාතික විගණන කාර්යාලයේ විගණන වාර්තාව 14(2) (c) - 2016 සහ කළමනාකරණයේ ප්‍රතිචාරය සමාලෝචනය කිරීම.

## විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්

2019 වර්ෂයේදී කමිටු රැස්වීම් 04ක් පවත්වන ලද අතර, කමිටුවේ ආරාධනාව මත මෙම සියළු රැස්වීම් සඳහා සාමාන්‍යාධිකාරි, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්) සහ අභ්‍යන්තර විගණක සහභාගි විය. රජයේ විගණන අධිකාරී සහ අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා ද නිරීක්ෂකයින් ලෙස සියලුම රැස්වීම් සඳහා සහභාගී වී සිටියහ.

කමිටු සාකච්ඡා සටහන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කරන අතර, රැස්වීම් සටහන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අතර, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී වැදගත් කරුණු ඉදිරිපත් කර සාකච්ඡා කරන ලදී.

**විගණන කමිටුව වෙනුවෙන්**



**සභාපති**

**විගණන හා කළමනාකරණ කමිටුව - 2019**

**ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. CAE/C/SFC/01/2019/01/20 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 19 September 2023

සභාපති

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව

**<u>ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ 2019 දෙසැම්බර් 31දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව</u>**

---

සහතික කළ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉහත සඳහන් වාර්තාව මේ සමග එවනු ලැබේ.

ටී.ජී.අයි. පද්මිණී

නියෝජ්‍ය විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

පිටපත: ලේකම් – මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය.

මගේ අංකය
எனது இல.
My No. } CAE/C/SFC/01/2019/01/20

ඔබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 19 September 2023

සභාපති

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව

**ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ 2019 දෙසැම්බර් 31දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය ව්‍යාවනය

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ (“සංස්ථාව“) 2019) දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 <u>මතය ව්‍යාවනය සඳහා පදනම</u>

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය - 01 හි අංක 32 ඡේදයට අනුව, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති මගින් අවශ්‍ය වේ නම් හෝ අවසර දී ඇත්නම් මිස, වත්කම් සහ බැරකම්, ආදායම් සහ වියදම් එකිනෙකට එරෙහිව හිලව් නොකළ යුතුය. කෙසේ වුවද, ගෙවිය යුතු සංචලන අත්තිකාරම්, ණය හිමියන්, ණය හිමි පාලනය - COBOL, උප කොන්ත්‍රාත් පාලනය, උප

කොන්ත්‍රාත් රඳවා තබා ගැනීම සහ සෘජු ගෙවීම් විකුණුම්කරුවන්ගේ ගිණුම්වල හර ශේෂයන් එම ගිණුම්වල බැර ශේෂවලට එරෙහිව හිලව් කර ඇත. එබැවින්, එවැනි ගිණුම්වල බැර ශේෂය රු. මිලියන 401.83 ක එකතුවකින් අඩුවෙන් දක්වා ඇත. තවද, සමස්ත ණය ශේෂය වූ රු. මිලියන 1,361.50 ක්, ලැබිය යුතු රඳවා ගැනීම්, පෙර ගෙවීම්, ලැබිය යුතු සංචලන අත්තිකාරම්, ආපසු ගෙවනු ලබන තැන්පතු, ඇණවුම සමඟ චෙක්පත, කොන්ත්‍රාත්තු කම්කරු අග්‍රිම, කම්කරු උප කොන්ත්‍රාත් පාලනය සහ වසර අවසානයේදී කම්කරු උප පාලන අත්තිකාරම් මෙම ගිණුම්වල හර ශේෂයන්ට එරෙහිව හිලව් කර ඇත. එබැවින් මෙම ගිණුම් සමාන ප්‍රමාණවලින් අඩුවෙන් දක්වා ඇත.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ අංක 51 ඡේදයට අනුකූලව - 16 දේපල, පිරියත සහ උපකරණ සහ ආයතනය එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේ සහ අපේක්ෂිත නම්, එහි වත්කම්වල සුන්බුන් වටිනාකම සහ ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය කළ යුතුය. අගයන් පෙර ඇස්තමේන්තුවලට වඩා වෙනස් වේ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 08 ට අනුකූලව ඇස්තමේන්තු දෝෂය නිවැරදි කළ යුතුය. කෙසේ වුවද, සංස්ථාව සමාලෝචිත වර්ෂය අවසානයේ රු.මිලියන 997.98 ක වටිනාකමක් ඇති මෙම වත්කම්වල සුන්බුන් වටිනාකම සහ ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය කර නොතිබුණි. තවද, සංස්ථාව සතු රු. මිලියන 1,057.60 ක වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඒවා අඛණ්ඩව උපයෝජනය කර තිබුණ ද, මෙම වත්කම්වල ඇස්තමේන්තුගත දෝෂය නිවැරදි කිරීමට යෝග්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) සංස්ථාව විසින් බැංකු අයිරාවට එරෙහිව රු.මිලියන 71.80 ක ආයෝජන සිදු කිරීමට ඇප වී ඇත. කෙසේ වුවද, SLFRS 07 - මූල්‍ය උපකරණ: හෙළිදරව් කිරීම්වල 14 වන ඡේදයේ විධිවිධාන අනුව, වාර්තා කරන දිනයේ එසේ ඇප වූ මුදල පිළිබඳව සංස්ථාව විසින් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ (NEMO)එවැනි ගිණුම්වල හර ශේෂයන්ට එරෙහිව රු. මිලියන 26.50 ක එකතුවක් වූ ණය ගැති බැර ශේෂ හිලව් කර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ (NEMO) ණය ගැතියන් එයට සමාන ප්‍රමාණයකින් අඩුවෙන් දක්වා ඇත.

(ඉ) රු. මිලියන 16.38 ක එකතුවක් වූ හඳුනා නොගත් ශේෂ දෙකක් වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ යටතේ පැවති බව නිරීක්ෂණය විය.

(ඊ) අන්තර් අංශ ශේෂ මූල්‍ය ප්‍රකාශනයේ ඇතුළත් නොකළ යුතු වුවද, ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ (NEMO) ලැබිය යුතු රු. මිලියන 647.20 ක් වෙනත් ලැබිය යුතු දෑ යටතේ ඇතුළත් කර තිබුණු අතර ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය (NEMO) විසින් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත ගෙවිය යුතු මුදල රු. මිලියන 514.12 ක් වෙනත් ගෙවිය යුතු දෑ යටතේ ඇතුළත් කර තිබුණි. එබැවින්, අනෙකුත් ලැබිය යුතු දෑ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ මෙම මුදල් ප්‍රමාණවලින් වැඩියෙන් සඳහන් කර ඇත. තවද, සංස්ථාවේ අංශ අතර පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම්වල ශේෂය වසර අවසානයේදී ශුන්‍ය විය යුතුය. කෙසේ වුවද, ජංගම ගිණුමේ අන්තර් අංශ හර ශේෂය වූ රු. මිලියන 1.82ක් මූල්‍ය ප්‍රකාශනවල වෙනත් ලැබිය යුතු දෑ යටතේ ඇතුළත් කර තිබුණි.

(උ) ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ (NEMO) මූල්‍ය ප්‍රකාශනයේ දක්වා ඇති ගොඩනැගිලි සහ අනෙකුත් ඉදිකිරීම්වලින් ලැබෙන ආදායම සහ විගණනයට ඉදිරිපත් කරන ලද ආදායම් උපලේඛනය අතර රු. මිලියන 106.47ක වෙනසක් නිරීක්ෂණය විය. කෙසේ වුවද, වෙනස්කම් සඳහා හේතු විගණනයට හෙළිදරව් වී නොතිබුණි.

(ඌ) පහත ශේෂයන් සඳහා ඉල්ලුම් කරන ලද උපකාරක ලේඛන සමඟ සාක්ෂි සපයා නොතිබුණි. එබැවින්, එවැනි ශේෂවල නිරවද්‍යතාවය සහ වලංගුභාවය සහතික කළ නොහැකි විය.

| | **ගිණුම් අයිතමය** | **වටිනාකම (රු. මිලියන)** | **සාක්ෂි ලබා දී නොමැති සාක්ෂි** |
|---|---|---|---|
| (අ) | ලැබිය යුතු වෙළඳ (වසර 3කට වැඩි සහ රු. මිලියන 50ට වැඩි) | 517.13 | ණය ගැති තහවුරු කිරීම් |
| (ආ) | සේවාලාභියාගෙන් එකතු කිරීම | 38.58 | සවිස්තරාත්මක උපලේඛනය |
| (ඇ) | වෙනත් ලැබිය යුතු ගිණුම් | 31.21 | සවිස්තරාත්මක උපලේඛනය |
| (ඈ) | පාරිභෝගික - සේවාව හේතුවෙන් | 543.92 | සවිස්තරාත්මක උපලේඛනය |
| (ඉ) | බැංකු ශේෂය | 1.88 | බැංකු තහවුරුව |
| (ඊ) | විලම්භිත බදුකරණය | 980.71 | භාවිත නොකළ බදු පාඩුවලට එරෙහිව බදු ගෙවිය හැකි ලාභ ලැබීමේ සම්භාවිතාව |

| | | | |
|---|---|---|---|
| | | | තක්සේරු කිරීම සඳහා විගණන සාක්ෂි විගණනයට සපයා නොතිබුණි. |
| (උ) | දේපළ, පිරියත සහ උපකරණ (NEMO) | 141.74 | 2019.12.31 දිනට ස්ථාවර වත්කම් ලේඛනය |
| (ඌ) | වෙළඳ ලැබිය යුතු මුදල් (NEMO) | 1,096.51 | තහවුරු කිරීම් |
| (එ) | සුළු මුදල් - අග්‍රිම (ආරම්භක ශේෂය - NEMO) | 2.72 | ආරම්භක ශේෂය සඳහා සවිස්තරාත්මක උපලේඛනය |
| (ඒ) | බැංකු ශේෂ (NEMO) | 5.62 | බැංකු ප්‍රකාශන සහ බැංකු තහවුරු කිරීම් |

ඉහත විස්තර කර ඇති පරිදි, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ ඇතුළත් ද්‍රව්‍යමය අයිතම විකල්ප ක්‍රම මගින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය.

මෙම කරුණුවල ප්‍රතිඵලයක් වශයෙන්, වාර්තාගත හෝ වාර්තා නොකළ ප්‍රමාණ සහ මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැදුම්ලත් අංග සම්බන්ධයෙන් කිසියම් ගැලපීමක් සිදු කිරීම අවශ්‍ය වූයේද යන්න තීරණය කිරීමට මට නොහැකි විය.

## 1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්</u>

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා හට ලබා ගැනීමට නොහැකි වූ අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් ඇති බව නිශ්චය කිරීමට මා හට නොහැකි විය.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද සියලුම නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාෘකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව

| | නීති, රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | 2019 දෙසැම්බර් 31 දිනට එකතුව රු. මිලියන 1,058.88 ක් වූ එකතු කළ අගය මත බදු මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත | 2019 දෙසැම්බර් 31 දිනට එකතුව රු. මිලියන 104.56 ක් වූ ජාතිය ගොඩනැගීමේ බදු මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සහ වාර්ෂික වාර්තාව ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත විගණකාධිපති වෙත ලබා දිය යුතුය. එසේ වුවද, සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2022 දෙසැම්බර් 12 වැනි දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි |
| (ඈ) | සංස්ථාවේ සභාපතිවරයා විසින් නිකුත් කරන ලද 1979 දෙසැම්බර් 20 දිනැති අංක 121/1979 දරන චක්‍රලේඛයේ 2(ඇ) වගන්තිය. | ඇණවුම් සහිත චෙක්පත් මගින් අත්තිකාරම් ලබා දුන් පසු, එවැනි අත්තිකාරම් දින 30 ක කාලයක් තුළ පියවිය යුතුය. කෙසේ වෙතත්, එකතුව රු. මිලියන 254.47 ක් වූ එවැනි අත්තිකාරම් වසර 03 කට වැඩි කාලයක් මුළුල්ලේ නිරවුල් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඉ) | සංස්ථාවේ සභාපතිවරයා විසින් නිකුත් කරන ලද මුදල් අත්තිකාරම්වලට අදාළ 1979 දෙසැම්බර් 20 දිනැති අංක 122/1979 දරන චක්‍රලේඛයේ 4 වගන්තිය. | සේවා හෝ භාණ්ඩ සැපයීම සඳහා මුදල් අත්තිකාරම් ලබා දුන් පසු, එවැනි අත්තිකාරම් දින 14ක කාලයක් තුළ නිරවුල් කළ යුතුය. කෙසේ වුවද, වසර 03ක් මුළුල්ලේ පැවති රු.මිලියන 27.73ක් වූ විශේෂ මුදල් අත්තිකාරම් ශේෂ 2019 දෙසැම්බර් 31 දින දක්වා ද නිරවුල් කර නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

**3.** <u>වෙනත් කරුණු</u>

(අ) රු. මිලියන 1,342.95 ක් වූ වෙළඳ ණයගැතියන් වසර 03 කට අධික කාලයක් මුළුල්ලේ අයකර නොතිබුණු අතර එය මුළු ණයගැති ශේෂයෙන් සියයට 48 ක් වේ. ලැබිය යුතු ශේෂය වන රු. මිලියන 929.23 ක් වසර 05 කට අධික කාලයක් මුළුල්ලේ ආපසු අය කර නොතිබුණි.

(ආ) එකතුව රු. මිලියන 10.56 ක් වූ ආදායම් බදු ශේෂය වර්ෂ 2013 සිට 2019 දක්වා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(ඇ) රු. මිලියන 477.23 ක් වූ ණයහිමි ශේෂයෙන් රු. මිලියන 443.90 ක මුදලක් වසර 03 ක් මුළුල්ලේ නිරවුල් කර නොතිබුණි.

(ඈ) ගෙවිය යුතු රඳවා ගත් මුදල්වලට අදාළ වූ ව්‍යාපෘති අනුව සවිස්තරාත්මක ප්‍රගතිය විගණනයට ලබා ගත නොහැකි විය. කෙසේ වුවද, රු. මිලියන 776.72 ක් වූ උප කොන්ත්‍රාත් රඳවා ගැනීම්වලින් රු. මිලියන 674.38 ක මුදලක් වසර 05 කට අධික කාලයක් මුළුල්ලේ රඳවා තබා ගෙන තිබුණි.

(ඉ) රු. මිලියන 685.21 ක් වූ ගෙවිය යුතු උප කොන්ත්‍රාත් මුදල වසර 03 කට අධික කාලයක් මුළුල්ලේ නිරවුල් කර නොතිබුණි.

(ඊ) ඉදිකිරීම් අංශය විසින් ක්‍රියාත්මක කරන ලද රු. මිලියන 6,821.22 ක වටිනාකමින් යුත් ව්‍යාපෘති 46 ක් සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 260.84 ක අලාභ ලබා ඇති අතර, 2019 දෙසැම්බර් 31 දිනට මුළු සමුච්චිත අලාභය රු. මිලියන 1,232.95 ක් විය. ඉදිකිරීම් සංරචක අංශය මගින් ක්රියාත්මක කරන ලද රු. මිලියන 258.67 ක් වටිනා ව්‍යාපෘති 04 ක් සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 9.39 ක අලාභයක් ලබා ඇති අතර 2019 දෙසැම්බර් 31 දිනට මුළු සමුච්චිත අලාභය රු. මිලියන 49.32 කි. තවද, යාන්ත්‍රික හා විදුලි අංශය මගින් ක්‍රියාත්මක කරන ලද රු. මිලියන 91.07 ක් වටිනා ව්‍යාපෘති 06 ක් සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 22.88 ක අලාභයක් ලබා ඇති අතර, 2019 දෙසැම්බර් 31 දිනට මුළු සමුච්චිත අලාභය රු. මිලියන 35.94 ක් විය. ජාතික යන්ත්‍රෝපකරණ සහ උපකරණ සංවිධානයෙන් (NEMO) මගින් ක්‍රියාත්මක කරන ලද රු. මිලියන 838.69 ක් වටිනා ව්‍යාපෘති 112 ක් සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 95.14 ක අලාභයක් ලබා ඇත.

(උ) ජංගම ගිණුම් 07ක රු. මිලියන 0.87ක් වූ බැංකු ශේෂ නිෂ්ක්‍රියව පැවති අතර, 2003 ජූනි 02 දිනැති අංක PED 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.4 වගන්තියට අනුව, බැංකු ගිණුම් අඛණ්ඩව පවත්වාගෙන යාමේ අවශ්‍යතාව සාධාරණීකරණය කිරීම සඳහා අර්ධ වාර්ෂිකව සමාලෝචනය කරමින් 2019 දෙසැම්බර් 31 දිනට අක්‍රීයව පවතින මෙම බැංකු ගිණුම් වසා දැමීමට කළමනාකාරීත්වය විසින් අවධානය යොමු කර නොතිබුණි

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

# ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව

## இலங்கை அரச பொறறியியற் கூட்டுத்தாபனம்

## STATE ENGINEERING CORPORATION OF SRI LANKA

**2019 දෙසැම්බර් මස 31 වන දිනයෙන්**
**අවසන් වර්ෂය සඳහා**
**ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන**

# ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව
## විස්තරාත්මක ආදායම් ප්‍රකාශය
## 2019 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| | සටහන් | 2019 (රු.) | 2018 (රු.) |
|---|---|---|---|
| ආදායම | **4** | **3,960,504,914** | 3,278,555,466 |
| විකුණුම් පිරිවැය | | **(4,620,708,690)** | (4,472,833,991) |
| **දළ ලාභය** | | **(660,203,776)** | (1,194,278,525) |
| වෙනත් ආදායම් | **5** | **466,566,685** | 138,389,556 |
| පරිපාලන වියදම් | | **(594,280,129)** | (443,417,858) |
| ශුද්ධ මූල්‍ය ආදායම් / (වියදම්) | **6** | **(391,425,969)** | (258,285,571) |
| **බදු පූර්ව ලාභ** | **7** | **(1,179,343,188)** | (1,757,592,398) |
| ආදායම් බදු වියදම් | **8** | **(218,465,942)** | (98,223,356) |
| **කාල පරිච්ඡේදයට අදාළ ලාභය** | | **(960,877,246)** | (1,855,815,754) |
| **වෙනත් විස්තරාත්මක ආදායම්** | | | |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත වූ ආයුගනක ඉපයීම්/පාඩු | | **(99,372,230)** | (1,588,292) |
| අලෙවිය සඳහා වූ මූල්‍ය මෙවලම්හී සාධාරණ අගයේ වෙනස | | **708,000** | (804,000) |
| දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය මත අතිරික්තය | | | |
| **වර්ෂය සඳහා වූ බදු රහිත වෙනත් විස්තරාත්මක ආදායම්** | | **(98,664,230)** | (2,392,292) |
| **වර්ෂය සඳහා විස්තරාත්මක ආදායම් එකතුව** | | **(1,059,541,476)** | (1,858,208,046) |

අදාළ ගිණුම් ප්‍රතිපත්ති හා විස්තරාත්මක සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල මුඛ්‍යාංගයක් වේ.
(වරහන් තුළ දැක්වෙන සංඛ්‍යා අවකරණ සනිටුහන් කරයි.)

# ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව
# මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
# 2019 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| | සටහන | 31.12.2019 (රු.) | 31.12.2018 (රු.) ප්‍රතිස්ථාපිත |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 9 | **7,898,780,088** | 7,920,400,710 |
| අස්පෘෂ්‍ය වත්කම් | 10 | **-** | 23,345 |
| කොටස් ආයෝජනය | 11 | **3,828,000** | 3,120,000 |
| විලම්බිත බදු | 12 | **980,712,209** | 762,246,266 |
| ව්‍යුත්පන්න වත්කම් ඇතුළුව වෙනත් මූල්‍ය වත්කම් | 15 | **5,029,968** | 6,480,565 |
| | | **8,888,350,265** | 8,692,270,886 |
| **ජංගම වත්කම්** | | | |
| වෙළෙඳ තොග | 13 | **587,267,998** | 480,200,440 |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | 14 | **6,590,618,947** | 5,267,786,918 |
| ව්‍යුත්පන්න වත්කම් ඇතුළුව වෙනත් ජංගම මූල්‍ය වත්කම් | 15 | **1,168,412,673** | 1,041,767,500 |
| මුදල් හා මුදල් සමාන දෑ | 16 | **444,316,641** | 566,839,296 |
| | | **8,790,616,258** | 7,356,594,154 |
| **මුළු වත්කම්** | | **17,678,966,524** | 16,048,865,040 |
| **හිමිකම් සහ වගකීම්** | | | |
| අනුදත් ප්‍රාග්ධනය | 17 | **70,000,000** | 70,000,000 |
| ප්‍රාග්ධන වර්ධන සංචිතය | | **27,738,806** | 27,738,806 |
| ප්‍රත්‍යාගණන සංචිතය | | **7,484,472,989** | 7,484,472,989 |
| යන්ත්‍රෝපකරණ ප්‍රාග්ධනය | | **(167,291,864)** | (167,291,864) |
| පොදු සංචිතය | | **3,602,690** | 3,602,690 |
| රඳවාගත් ඉපයීම් | | **(4,437,794,022)** | (3,383,482,244) |
| **මුළු හිමිකම් අයිතිය** | | **2,980,728,599** | 4,035,040,377 |
| **ජංගම නොවන වත්කම්** | | | |
| ජංගම නොවන බැරකම් | | | |
| පොළී දරන බැරකම් | 18 | **2,370,045,245** | 2,101,800,000 |
| සේවක ප්‍රතිලාභ | 19 | **421,114,429** | 310,032,375 |
| ව්‍යුත්පන්න වගකීම් ඇතුළුව වෙනත් ජංගම නොවන බැරකම් | 20 | **-** | - |
| | | **2,791,159,674** | 2,411,832,375 |
| **ජංගම වගකීම්** | | | |
| ජංගම බැරකම් | | | |
| පොළී දරන බැරකම් | 18 | **80,433,889** | 154,332,096 |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | 21 | **8,454,761,917** | 6,674,908,044 |
| ව්‍යුත්පන්න වගකීම් ඇතුළුව වෙනත් ජංගම බැරකම් | 20 | **2,910,152,997** | 2,412,183,921 |
| ගෙවිය යුතු ආදායම් බදු | 22 | **10,564,395** | 10,564,395 |
| බැංකු අයිරා | 16 | **451,165,053** | 350,003,832 |
| | | **11,907,078,252** | 9,601,992,288 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | **17,678,966,524** | 16,048,865,040 |

මෙම මූල්‍ය ප්‍රකාශය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවන අයුරින් සකස් කරනු ලැබ ඇත.

අත්සන් කලේ.
පී.එම්.ඒ. කරුණාසිංහ
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය)

මෙහි දැක්වෙන අධ්‍යක්ෂ මණ්ඩලයේ සහතිකය රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක 45 හී අනුදේශයන්ට අනුකූල වේ. අදාළ ගිණුම් ප්‍රකාශ, ගිණුම් ප්‍රතිපත්ති හා විස්තරාත්මක සටහන් ද මෙම මූල්‍ය ප්‍රකාශනයේම සමස්ත කොටසක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ සැකසීම හා ඉදිරිපත් කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වන අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත ඔවුන් වෙනුවෙන් අත්සන් තබමු.

අත්සන් කලේ.
නීතිඥ රත්නසිරි කළුපහන
සභාපති

අත්සන් කලේ.
මනෝරී ලියනගේ
අධ්‍යක්ෂ

## ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව
## හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය
## 2019 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| | අනුදත් ප්‍රාග්ධනය (රු.) | ප්‍රාග්ධන වර්ධන සංචිත (රු.) | ප්‍රත්‍යාගණන සංචිත (රු.) | පොදු සංචිත (රු.) | යන්ත්‍රෝපකරණ ප්‍රාග්ධනය (රු.) | අලෙවිය සඳහා වූ සංචිත (රු.) | රැඳවූ ඉපැයුම් (රු.) | එකතුව (රු.) |
|---|---|---|---|---|---|---|---|---|
| **2018 ජනවාරි 01 දිනට ශේෂය** | 70,000,000 | 27,738,806 | 7,484,472,989 | 3,602,690 | (167,291,864) | - | (999,390,377) | 6,419,132,244 |
| වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ මත ගැළපුම් | | | | | | | (1,186,750) | (1,186,750) |
| සේ.අ.අ. හි සහ සේ.නි.භා.අ. හි හිඟ මුදල් | | | | | | | (461,733,423) | (461,733,423) |
| සේ.අ.අ. හි සහ සේ.නි.භා.අ. හි දඩමුදල් | | | | | | | (62,963,648) | (62,963,648) |
| **ප්‍රතිප්‍රකාශිත පරිදි 2018.01.01 දිනට ශේෂය** | 70,000,000 | 27,738,806 | 7,484,472,989 | 3,602,690 | (167,291,864) | - | (1,525,274,198) | 5,893,248,423 |
| වර්ෂය සඳහා වූ ලාභය | | | | | | | (1,854,204,236) | (1,854,204,236) |
| වෙනත් විස්තීර්ණ ආදායම් - ආයුගනක අලාභ | | | | | | | (3,199,812) | (3,199,812) |
| වෙනත් විස්තීර්ණ ආදායම් - සාධාරණ අගයේ වෙනස | | | | | | | (804,000) | (804,000) |
| කාල පරිච්ඡේදය සඳහා වූ මුළු වෙනත් විස්තීර්ණ ආදායම් | - | - | - | - | - | - | (4,003,812) | (4,003,812) |
| **කලින් වාර්තා කල පරිදි 2018.12.31 දිනට ශේෂය** | 70,000,000 | 27,738,806 | 7,484,472,989 | 3,602,690 | (167,291,864) | - | (3,383,482,246) | 4,035,040,375 |
| **නැවත ප්‍රකාශ කිරීම** | | | | | | | | |
| වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ මත ගැළපුම් | | | | | | | (4,829,480) | (4,829,480) |
| වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ මත ගැළපුම් | | | | | | | 10,059,180 | 10,059,180 |
| **ප්‍රතිප්‍රකාශිත පරිදි 2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 70,000,000 | 27,738,806 | 7,484,472,989 | 3,602,690 | (167,291,864) | - | (3,378,252,546) | 4,040,270,075 |
| වර්ෂය සඳහා වූ ලාභය | | | | | | | (960,877,246) | (960,877,246) |
| වෙනත් විස්තීර්ණ ආදායම් - ආයුගනක අලාභ | | | | | | | (99,372,230) | (99,372,230) |
| වෙනත් විස්තීර්ණ ආදායම් - සාධාරණ අගයේ වෙනස | | | | | | | 708,000 | 708,000 |
| කාල පරිච්ඡේදය සඳහා වූ මුළු වෙනත් විස්තීර්ණ ආදායම් | - | - | - | - | - | - | (98,664,230) | (98,664,230) |
| **2019.12.31 දිනට ශේෂය** | 70,000,000 | 27,738,806 | 7,484,472,989 | 3,602,690 | (167,291,864) | - | (4,437,794,022) | 2,980,728,598 |

(වරහන් තුළ දැක්වෙන සංඛ්‍යා අවකරණ සනිටුහන් කරයි.)

# ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව
## මුදල් ප්‍රවාහ ප්‍රකාශය
## 2019 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| | 31.12.2019 (රු.) | 31.12.2018 (රු.) |
|---|---|---|
| **මුදල් ප්‍රවාහ - මෙහෙයුම් ක්‍රියාකාරකම්** | | |
| බදු අඩු කිරීමට පෙර ලාභය | (1,179,343,189) | (1,757,592,398) |
| **ගැළපීම්,** | | |
| දේපළ, පිරියත හා උපකරණ ක්ෂයවීම් | 36,212,915 | 164,200,486 |
| දේපළ, පිරියත හා උපකරණ අපහායනය / කපා හැරීම් | | |
| අස්පෘශ්‍ය වත්කම් සඳහා ක්‍රමක්ෂය | 23,345 | 280,113 |
| ගලපාත වත්කම් කොටස් කර ඉවත් කිරීම | - | - |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් සඳහා ප්‍රතිපාදන | 55,285,953 | 44,233,101 |
| බොල් ණය සහ අඩමාන ණය සඳහා ප්‍රතිපාදනය (ප්‍රත්‍යාවර්තනය) | 122,509,182 | 258,226,245 |
| අභාවිත තොග සඳහා ප්‍රතිපාදනය (ප්‍රත්‍යාවර්තනය) | 41,594 | 3,957,438 |
| ආදායම් බදු සඳහා ප්‍රතිපාදනය (ප්‍රත්‍යාවර්තනය) | - | (20,106,452) |
| ගෙවිය යුතු පොලී වියදම් | (49,065,944) | - |
| ප්‍රදාන ක්‍රමක්ෂය | (450,000,000) | (113,787,343) |
| බැංකු ගාස්තු | - | - |
| පොලී ආදායම් | (23,748,333) | (22,380,911) |
| පොලී වියදම් | 399,538,158 | 269,576,560 |
| **කාරක ප්‍රාග්ධන වෙනස් වීම් වලට පෙර මෙහෙයුම් ලාභය** | (1,088,546,319) | (1,173,393,161) |
| ඉන්වෙන්ට්‍රි භාණ්ඩ (වැඩි වීම) / අඩු වීම | (107,109,152) | 32,158,648 |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ (වැඩි වීම) / අඩු වීම | (979,822,601) | (3,455,790) |
| ජංගම මූල්‍ය වත්කම් (වැඩි වීම) / අඩු වීම | (120,463,452) | (73,422,954) |
| වෙනත් ජංගම මූල්‍ය වගකීම් (වැඩි වීම) / අඩු වීම | 296,069,076 | 534,635,133 |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ (වැඩි වීම) / අඩු වීම | 1,319,564,955 | 153,955,216 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් ඉපයූ / (යෙදවූ) මුදල්** | (680,307,494) | (529,522,907) |
| පොලී ගෙවීම් | (153,300,491) | (269,576,560) |
| පාරිතෝෂික ගෙවීම් | (43,576,129) | (22,101,153) |
| ආදායම් බදු ගෙවීම් | - | - |
| **මෙහෙයුම් ක්‍රියාවලියෙන් ඉපයූ (ක්‍රියාවලියට යොදාගත්) ශුද්ධ මුදල් ප්‍රමාණය** | (877,184,113) | (821,200,620) |
| **ආයෝජන කටයුතු වලින් ලද මුදල් ප්‍රමාණය** | | |
| දේපළ, පිරියත හා උපකරණ මිලදී ගැනීම | (15,494,848) | (12,130,660) |
| කල් බදු මූලික ගෙවීම් | - | - |
| පොලී ලැබීම් | 23,748,333 | 22,380,911 |
| **ආයෝජන කටයුතු වලින් ලද (ක්‍රියාවලියට යොදාගත්) ශුද්ධ මුදල් ප්‍රමාණය** | 8,253,484 | 10,250,251 |
| **මූල්‍ය කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| දිගුකාලීන ණයට ගැනීම් | 302,369,250 | 2,071,000,000 |
| කල් බදු ආපසු ගෙවීම් | (4,332,096) | (4,186,776) |
| ණය ආපසු ගෙවීම් | (102,790,402) | (614,149,003) |
| ප්‍රදාන ලැබීම් | 450,000,000 | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ලද (ක්‍රියාවලියට යොදාගත්) ශුද්ධ මුදල් ප්‍රමාණය** | 645,246,751 | 1,452,664,221 |
| **කාල පරිච්ඡේදය තුළ මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩි වීම/ (අඩු වීම)** | (223,683,878) | 641,713,852 |
| කාල පරිච්ඡේදය තුළ ආරම්භයේ පැවති මුදල් හා මුදල් සමාන දෑ | 216,835,466 | (424,878,389) |
| **කාල පරිච්ඡේදය අවසානයේ පැවති මුදල් හා මුදල් සමාන දෑ** | (6,848,412) | 216,835,465 |

අදාළ ගිණුම් ප්‍රතිපත්ති හා විස්තරාත්මක සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල මුඛ්‍යාංගයක් වේ.
(වරහන් තුළ දැක්වෙන සංඛ්‍යා අවකරණ සහිටුහන් කරයි.)

## 1. පොදු

### 1.1 වාර්තාකරණයට හසු කෙරෙන ආයතනය

1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1962 ජනවාරි මස 1 වන දින ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ ලියාපදිංචි කළ ප්‍රධාන කාර්යාලය කොළඹ 2, ඩබ්ලිව්.ඒ.ඩී. රාමනායක මාවත, අංක 130 දරන ස්ථානයේ පිහිටා ඇත.

### 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම්වල ස්වභාවය

මූලික වශයෙන් ඉදිකිරීම් ක්‍රියාකාරකම් ව්‍යාපාරයේ නියැලී සිටින රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, සිවිල් ඉංජිනේරු ඉදිකිරීම් කාර්මික හා විදුලි ඉංජිනේරු, ගෘහ නිර්මාණ හා ඉංජිනේරු උපදෙස් සේවා, පෙර සවි උපාංග හා සිවිල් ඉංජිනේරු ව්‍යාපෘති සඳහා උපාංග සහ ගොඩනැගිලි ද්‍රව්‍ය නිෂ්පාදනය සහ සේවාවන් සපයයි.

## 2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි සම්පිණ්ඩනය

### 2.1 අනුකූලතා ප්‍රකාශය

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, මුදල් තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සමග ගිණුම් ප්‍රතිපත්ති හා මුදල් ප්‍රකාශ පිළිබඳ සටහන් සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනයන්හි අඩංගු වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය මගින් නිර්දේශකර නිකුත් කරන ලද ගිණුම් ප්‍රමිති හා සම්මතයන්ට අනුකූල වන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම් ප්‍රතිපත්තීන්ට අනුව මෙම ගිණුම් ප්‍රකාශ සකසා ඇත.

2022.11.30 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලැබූ තීරණයට අනුව මූල්‍ය ප්‍රකාශ සඳහා අනුමැතිය ප්‍රදානය කරන ලදී.

### 2.2 ගණනය කිරීමේ පදනම

මුදල් තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ පහත දැක්වෙන ද්‍රව්‍ය අයිතම හැර, මෙම මූල්‍ය ප්‍රකාශනය ඓතිහාසික පිරිවැය පදනම මත ගිණුම් ප්‍රතිපත්තීන්ට අනුකූලව සකසා ඇත.

- සාධාරණ අගයට ගණනය කරන ලද මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම්.
- ව්‍යාපෘති ඒකක ණය ක්‍රමය පදනම්ව හඳුනාගත් සේවක ප්‍රතිලාභ වගකීම (ලංකා ගිණුම් ප්‍රමිත අංක 19)
- දේපළ, යන්ත්‍ර හා උපකරණ සහ වාහන ප්‍රත්‍යාගණන අගයට දක්වා ඇත.

ඉදිරියට තම ව්‍යාපාර කාර්යය සාර්ථක ලෙසඳ කරගෙන යාමෙහිලා සංස්ථාවලට ඇති හැකියාව පිළිබඳව අධ්‍යක්ෂකවරුන් තත්සේරුකර ඇති අන්දමට නුදුරු අනාගතයේදී සංස්ථාවේ ව්‍යාපාර කටයුතු අත්හිටුවීමේ හෝ ඈවර කිරීමේ අවශ්‍යතාවයක් ඔවුන් නොදකී.

### 2.3 කෘත්‍යාත්මක හා ඉදිරිපත් කරනු ලබන ව්‍යවහාර මුදල

සංස්ථාවේ කෘත්‍යාත්මක ව්‍යවහාර මුදල වන ශ්‍රී ලංකා රුපියල් මගින් මෙම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කර ඇත. සියලු අගයන් ආසන්න රුපියලට ගණනය කර වටරවුම් කර ඇත.

### 2.4 ඇස්තමේන්තු හා නිශ්චයමති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශ සැකසීමේදී හා ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කිරීමේදී දක්වා ඇති වත්කම්, වගකීම්, අය සහ වැය පිළිබඳව තක්සේරු කිරීම්, උපකල්පනය හා විනිශ්චය කිරීම් කළමනාකරණය මගින් කළයුතු වේ. නිශ්චයමතීන් හා තක්සේරු කිරීම් අතීත අත්දැකීම් හා වෙනත් කරුණු අතර පවතින තත්වයන් යටතේ සාධාරණයයි විශ්වාස කෙරෙන බලාපොරොත්තු මත පදනම් වේ. ඒ අනුව, සත්‍ය අත්දැකීම් හා ප්‍රතිඵල, විනිශ්චයන් හා තක්සේරු කිරීම්වලට වඩා වෙනස් විය හැක.

## 3. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති

විශේෂිතව සඳහන් කර ඇති අවස්ථාවන්හිදී හැර, මෙම මූල්‍ය ප්‍රකාශයන්හි පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සෑම කාල පරිච්ඡේදයක් සඳහාම ඒකාකාරව භාවිතා කර ඇත.

### 3.1 විදේශ ව්‍යවහාර මුදල්

#### 3.1.1 විදේශ ව්‍යවහාර මුදල් ගණුදෙනු

සංස්ථාවේ මූල්‍ය වාර්තා සැකසීමේදී, ආයතනයේ කෘත්‍යාත්මක ව්‍යවහාර මුදල් (විදේශ ව්‍යවහාර මුදල්) හැරුනු විට, අනෙකුත් ගනුදෙනු වලදී එම දිනට අදාළ විනිමය ප්‍රතිශතයට අනුව ඒවා ගණනය කර සඳහන් කර ඇත. සෑම වාර්තා කෙරෙන දිනකම, විදේශ ගනුදෙනු,අදාළ දිනය අවසානයේ පැවති විනිමය ප්‍රතිශතය අනුව පරිවර්තනය කර සඳහන් කර ඇත. සාධාරණ අගයකට ගණනයකරනු ලබන මුදල් නොවන අයිතම, එම සාධාරණ මිල ගණනය කළ දිනට පැවැති විනිමය අනුපාතයට අනුව පරිවර්තනය කර ගණනය කර ඇත. අතීත මිලකට ගණනය කළ මුදල් නොවන අයිතම, අදාළ ගනුදෙනුව සිදුවන දිනයේ විනිමය අනුපාතයට පරිවර්තනය කර ගණනය කර ඇත. මූල්‍ය අයිතම පියවීමේ දී හා මූල්‍ය අයිතම පරිවර්තනය කිරීමේ දී මතුවන විනිමය අනුපාත වෙනස්කම්,අදාළ කාල සීමාවේ ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි අඩංගු කෙරේ.

### 3.2 වත්කම් හා ඒවායේ තක්සේරු කිරීමේ පදනම

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ දැනට පවතින වත්කම් ලෙසට වර්ග කර ඇති වත්කම් වනුයේ, සංස්ථාවේ සාමාන්‍ය ව්‍යාපාර මෙහෙයුම් ක්‍රියාවලියේ කාලය හෝ අදාළ මූල්‍ය ප්‍රකාශ වාර්තා කෙරෙන දින සිට වසරක කාලය යන දෙකින් අඩු කාලයක් තුළ උපලබ්ධි කර ගත හැකි වේයැයි අපේක්ෂා කරන මුදල් හා බැංකු ශේෂයන් ය. දැනට පවතින වත්කම් වලට අමතර වත්කම් වන්නේ, වාර්තා කෙරෙන දින සිට වසරකට වැඩි කාලයක් රඳවා ගැනීමට සංස්ථාව බලාපොරොත්තු වන වත්කම් ය.

#### 3.2.1 දේපළ, පිරියත හා උපකරණ

##### 3.2.1.1 හඳුනා ගැනීම් සහ මානනය

සමුච්චිත ක්ෂය වීම් හා සමුච්චිත දුබලතා අලාභ අඩු කළ පිරිවැයට දේපළ, පිරියත හා උපකරණ සඳහන් කෙරේ.

දේපළක යන්ත්‍ර හා උපකරණවල යම් යම් කොටස් වල ප්‍රයෝජනයට ගත හැකි කාලය වෙනස් වේ නම්, එම කොටස් වෙන් වෙන් අයිතම වශයෙන් (ප්‍රධාන උපාංග) දේපළ, පිරියත සහ උපකරණ ලෙස ගණනය කෙරේ.

### 3.2.1.2 අයිතිය හිමි වත්කම්

යම් දේපළක, යන්ත්‍රයක හෝ උපකරණයක අගය තුළ එය මිලදීගත් අගය සහ එය අපේක්ෂිත කාර්යය සඳහා යොදා ගැනීමට වැය වන මුදලද අඩංගු වේ. ස්වයං ඉදිකිරීම් වත්කම් සඳහා අමුද්‍රව්‍ය මිල, සෘජුකම්කරු ශ්‍රමය හා එය ප්‍රයෝජනයට ගැනීම පිණිස අවශ්‍ය වෙනත් ගුණාත්මක වැය වීම්ද අඩංගු කෙරේ. එම අයිතමය කොටස් වශයෙන් වෙන්කර එක් ස්ථානයක සිට අවශ්‍ය වෙනත් ස්ථානයකට ප්‍රවාහනය කර නැවත සවිකිරීම් සඳහා වන වැයවීම්ද,තත්වාගණන වත්කම් මතණයට ගැනුම් පිරිවැය ද මෙහි අඩංගු වේ.

උපකරණයක ක්‍රියාකාරිත්වයට ඒකාබද්ධ වූ මෘදුකාංග මිලදී ගැනීමේදී එය උපකරණයේ කොටසක් ලෙසට ප්‍රාග්ධනිත කෙරේ.

### 3.2.1.3 කල් බදු වත්කම්

සියලුම අවදානම් හා අයිති ප්‍රදානය ලබන අනුදේශ මත ගන්නා සියලුම බදු වත්කම් මූල්‍ය බදු ලෙසට වර්ග කෙරේ. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව එහි සාධාරණ අගයේ අවමය සහ බදු වාරිකයේ අවමයට සමාන මුදලකට අගය කෙරේ. මූලික හඳුනාගැනීමට අනතුරුව එම වත්කමට අදාළ වන ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුකූලව ගණන් තැබේ. කුලී වාරික ගෙවීම්, කුලී බදු වියදම් හා බදු වගකීම් අඩුවීම අතර බෙදා වෙන් කෙරේ. ඒ අනුව, වගකීම් ඉතිරි ප්‍රමාණය සඳහා ස්ථාවර පොලී අනුපාතයක් රඳවා ගැනීම පහසු වේ. ආදායම් ප්‍රකාශයේ කුලී බදු වියදම් අයකිරීම් මුදල් වියදම් ලෙසට හඳුනා ගැනේ. අනිකුත් කුලී බදු ක්‍රියාකාරී කුලී ලෙසට සැලකෙන අතර සංස්ථාවේ මුදල් තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ පිළිගැනීමට ලක් නොවේ.

### 3.2.1.4 තදන්තර පිරිවැය

යම් දේපළක, යන්ත්‍රයක හෝ උපකරණයක කොටසක් අලුතින් යෙදීමට සිදුවීමේදී, එම කොටස යෙදීම තුළින් ආයතනයට වන ආර්ථික යහපත සහ එහි අගය ස්ථිර ලෙසට ගණනය කල හැකි යයි පෙනී යයි නම් එම අයිතමයේ පිළිගත් අගයට එම වැයවීම සම්බන්ධ වේ. අලුතින් යෙදූ කොටසේ පවතින අගය පිළිගැනීමට ලක් නොවේ.

දේපළ, යන්ත්‍ර හා උපකරණ වල දෛනික නඩත්තු වියදම් ලාභ හෝ අලාභ ප්‍රකාශයේ සටහන් වේ.

### 3.2.1.5 නොපිළිගැනීම

දේපළක, යන්ත්‍රයක හෝ උපකරණයක පවතින ධාරණමය අගය එම යම් අයිතමයක් අපහරණය කිරීමේ දී හෝ එය නැවත භාවිත කිරීමේ දී හෝ විනයාස කිරීමේ දී ආයතනයට ඉදිරියේදී කිසිදු ආර්ථික වාසියක් අත් නොවේ නම්, එබඳු දේපළක, යන්ත්‍රයක හෝ උපකරණයක පවතින අගය නොපිළිගැනේ. එසේ නොපිළිගැනීම මත සිදු වන ලාභ හෝ අලාභ,ලාභ හෝ අලාභ ප්‍රකාශයේ වෙනත් ආදායම් තුළ හඳුනා ගැනේ.

### 3.2.1.6 ප්‍රත්‍යාගණනය

යටත් පිරිසෙයින්, සෑම වසර තුනකටම වරක් සන්තක ඉඩම් සහ ගොඩනැගිලි විවෘත වෙළඳපොළ අගයන් භාවිතා කර වෘත්තීය සුදුසුකම් ලත් තක්සේරුකරුවන් මගින් ප්‍රතිතක්සේරු කිරීම සිදු කෙරේ. ඉන්පසුව ප්‍රතිතක්සේරු මුදලට දේපළ සටහන් කර, ඇගැයීම් අතිරික්තය වත්කමේ පවතින

ධාරණමය ශුද්ධ අගය මත හඳුනා ගෙන ප්‍රත්‍යාගණනය අතිරේකයකට ස්ථානාන්තර කෙරේ. දේපළ පිළිනොගැනීමේ අවස්ථාවේදී ප්‍රත්‍යාගණනය අතිරික්තය රඳවාගත් ඉපයීමක් ලෙසට ස්ථානාන්තර කෙරේ.

### 3.2.1.7 ක්ෂය වීම

ක්ෂය වීමේ ප්‍රමාණය අනුව ක්ෂය වීම ගණනය කෙරේ. එනම්, වත්කමේ අගය හෝ අය වීමට ආදේශ කළ වෙනත් අගයකින් වත්කමේ පවතින ඉතිරි අගය අඩුකළ පසු ලැබෙන ඉතිරි අගයයි.

දේපළක, යන්ත්‍රයක හෝ උපකරණයක එක් එක් උපාංගයන් ඵලදායි කාල සීමාව ඇස්තමේන්තු කිරීම් මත ලාභ හෝ පාඩු අනුව සරල මාර්ග ක්‍රමය මත කෙරෙන්නේ, එමගින් වත්කමේ පවතින ආර්ථික ඵලදායීතාව ඉදිරියේදී ප්‍රයෝජනයට ගැනෙන ආකාරය වඩාත් පැහැදිලි ලෙසට පෙන්නුම් කරන බැවිනි. බදු කාලය අවසානයේදී ඒවා සංස්ථාවට අයිතිය හිමිවීම ස්ථිර තත්වයකදී හැර බදු ක්‍රම යටතේ පවතින අයිතම පිළිබඳ ක්ෂය වීම පිරික්සීමේදී බදු කාලය සහ අයිතමයේ ඵලදායී කාලසීමාව යන දෙකෙන් අඩු කාල සීමාවට ගණනය කෙරේ. ඉඩම් අගයන් ක්ෂය කිරීමක් සිදු නොවේ.

ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාලයන් පහත සඳහන් පරිදි වේ.

| **වත්කම වර්ගය** | **ප්‍රයෝජ්‍ය ආයු කාලය** (අවුරුදු) | **අගය ක්ෂය විමේ** අනුපාතය (%) |
|---|---|---|
| ගොඩනැගිලි | 40 | 2.5% |
| යන්ත්‍ර හා උපකරණ | 05 | 20% |
| ලී බඩු හා සවිකිරීම් | 10 | 10% |
| රථවාහන | 05 | 20% |
| කාර්යාල උපකරණ | 05 | 20% |
| පරිගණක | 05 | 20% |

පරිහරණය සඳහා පවතින කාලය තුළ වත්කමක මුල් කාලයේ සිටම එහි ක්ෂයවීම් ආරම්භ වන අතර එම වත්කම් විකිණීම සඳහා නියම වීම සහ ඒ අනුව එම වත්කම පිළිගැනීමට ලක්වන දින සිට ක්ෂයවීම් නතර කෙරේ.

ක්ෂය කිරීමේ ක්‍රමවේදය, ප්‍රයෝජ්‍ය ආයු කාලය සහ ඉතිරි අගය සෑම මුදල් වර්ෂයකම අවසානයේ සමාලෝචනය කෙරෙන අතර සුදුසු අන්දමට ගැළපුම්වලට ලක් කෙරේ.

### 3.2.2 කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ

වර්ෂය තුළදී වියදම් දරන ලද, වාර්තා කෙරෙන දිනට නිම නොවූ සේවාවන් කෙරෙමින් පවතින ප්‍රාග්ධන වැඩ ලෙසට පෙන්නුම් කෙරේ. වර්ෂය තුළ නිමකළ ප්‍රයෝජනයට ගත හැකි ප්‍රාග්ධන වත්කම්, දේපළ,පිරියත හා උපකරණ ලෙසට මාරු කර ඇත.

### 3.2.3 අස්පෘශ්‍ය දේපළ

අස්පෘශ්‍ය වත්කමක් හඳුනා ගැනෙනුයේ, වත්කම් හේතුවෙන් ආයතනයට ආර්ථික ප්‍රතිලාභ ලැබීම අනුමාන වන අවස්ථාවකදී හා අදාළ වත්කමෙහි පිරිවැය විශ්වාසදායක ලෙස මානනය කළ හැකිවීමෙන් පසුව සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත දුබලතා අඩුකරන ලද පිරිවැය වෙත එය ගෙන ඒමට හැකි අවස්ථාවකදීය.

### 3.2.3.1 මෘදුකාංග

ආයතන මෘදුකාංග සහ අභ්‍යන්තරයෙන් සම්බන්ධ නොවන පැහැදිලිව හඳුනාගත හැකි, විශ්වාසනීය ලෙසට ගණනය කළ හැකි අනාගතයේදී ආර්ථික අර්ථලාභ අපේක්ෂා කළ හැකි සියලුම පරිගණක මෘදුකාංග පිරිවැය අස්පෘශ්‍ය වත්කම් ප්‍රභේදය යටතේ මුදල් තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ අඩංගු කෙරේ.

### 3.2.3.2 තදන්තර පිරිවැය

අදාළ වන වත්කමට අන්තර්ගත අනාගත ආර්ථික ලාභ වර්ධනයක් වේ නම් පමණක් තදන්තර වැය ප්‍රාග්ධනිත කෙරේ. අනිකුත් වියදම් සියල්ල දරන ලද ලාභ හෝ පාඩු ලෙසට ලාභ හෝ අලාභ ප්‍රකාශයේ පිළිගැනේ.

### 3.2.3.3 ක්‍රමක්ෂය

ක්‍රමක්ෂය ගණනය කෙරෙනුයේ වත්කම්වල පිරිවැය ප්‍රමාණය හෝ වත්කම් සඳහා ආදේශිත වෙනත් ගණන් ප්‍රමාණ අඩුකළ පසු ලැබෙන අවශේෂ අගය මතය.

ලාභ හෝ අලාභ තුළ අස්පෘශ්‍ය වත්කම් විෂයෙහි ක්‍රමක්ෂය හඳුනා ගැනෙනුයේ සරළ මාර්ග පදනමක් මත ඒවා ප්‍රයෝජනය සඳහා පවත්නා දිනයේ සිට ආරම්භ වන එහි ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාලය අනුවය. මෙසේ සිදු කෙරෙනුයේ එකී වත්කම්වල සංයුක්තව පවත්නා අනාගත ආර්ථික ප්‍රතිලාභවල අපේක්ෂිත පරිභෝජන රටාව එමගින් නිරූපණය කරනු ලබන නිසාය. ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාලයන් පහත සඳහන් පරිදි වේ.

| වත්කම් ප්‍රභේදය | ඵලදායී කාලය (අවුරුදු) | ක්ෂයවීමේ ප්‍රතිශතය(%) |
|---|---|---|
| පරිගණක මෘදුකාංග | 05 | 20% |

ක්‍රමක්ෂය මාර්ග ප්‍රයෝජ්‍ය ආයුකාලය සහ අවශේෂ අගය සෑම මුදල් වර්ෂයකම අවසානයේදී සමාලෝචනයට ලක් කර උචිත වේ නම්, ඊට ගැළපුම් සිදුකෙරේ.

## 3.2.4 වෙළඳ තොග

වෙළඳ තොග සඳහන් කෙරෙනුයේ, යල් පිනූ හා මන්දගාමීව චලනය වන විෂයාංග සඳහා නිසි ඉඩහැරීම් වලින් අනතුරුව ඒවායේ පිරිවැය අගය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයටය. වෙළඳ තොගවල පිරිවැය සමන්විත වනුයේ, ඒවා මිලදී ගැනීම සඳහා දරන ලද සියලු වියදම්ද, ඒවායේ පරිවර්ත්‍ය වියදම් හා ඒවා දැනට තබා ඇති ස්ථාන වෙත හා ඒවායේ වර්තමාන තත්වය වෙත ගෙන ඒම සඳහා දරන ලද අනෙකුත් පිරිවැයද යනාදියෙනි. වෙළඳ තොගවල ශුද්ධ උපලබ්ධි අගය වනුයේ, දැනට ඒවායෙහි පවත්නා විකිණිය හැකි තත්වයට අදාළ අගයෙන් ඒවායේ ශුද්ධ උපලබ්ධි පිරිවැය හා/හෝ ඒවායේ පරිවර්ත්‍ය වටිනාකම අඩුකළ සාමාන්‍ය ව්‍යාපාරික තත්වයන් යටතේ විකිණිය හැකි ඒවායේ ඇස්තමේන්තුගත වටිනාකමයි.

වෙළඳ තොගවල ආපසු අයකරගත හැකි අගය තක්සේරු කිරීම සඳහා සෑම රපෝර්තු කාලපරිච්ඡේදයක් අවසානයේ දී වෙළඳ තොගවල සංචලන සමාලෝචනයට භාජනය කරනු ලබන

අතර ආපසු අයකරගත නොහැකි වෙතැයි යනුවෙන් හඳුනා ගනු ලබන විෂයාංග වර්ෂය තුළ දී ලියා අස්කරනු ලබනවා ඇත.

### 3.2.5 කෙරෙමින් පවත්නා වැඩ

අනාගත වැඩ කටයුතු සඳහා දරනු ලබන කොන්ත්‍රාත්තමය පිරිවැය ඒවායේ අගය ආපසු අයකරගත හැකි වේදැයි අනුමාන කරනු ලබන කල්හී, වත්කමක් ලෙස හඳුනා ගනු ලබන අතර එබඳු පිරිවැය කෙරෙමින් පවත්නා වැඩ යනුවෙන් හඳුනා ගැනේ. ඒවායේ විචලනය හා ඊට හිමිකම් පෑම කොන්ත්‍රාත් ආදායම තුළ හඳුනා ගැනෙනුයේ, අදාළ පාරිභෝගිකයා විසින් ඒවායේ විචලනය හා හිමිකම්පෑම සම්බන්ධයෙන් අනුමැතිය ලබා දෙතැයි අනුමාන කෙරෙන්නා වූ හා අදාළ ආදායම් ප්‍රමාණය විශ්වාසදායක ලෙස මැනිය හැකි වන්නා වූ අවස්ථාවේදී පමණි. ඒවා මෙලෙස ආදායමෙහි හඳුනා ගනු ලබන තෙක් විචලනය හා හිමිකම් පෑම් සඳහා දරනු ලබන පිරිවැය කෙරෙමින් පවත්නා වැඩ යනුවෙන් වර්ගීකරණය කෙරේ.

### 3.2.6 මුදල් හා මුදල් සමාන දෑ

දන්නා මුදල් ප්‍රමාණවලට වහා පරිවර්තනය කළ හැකි හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යයන් සඳහා ඉල්ලූ විට ආපසු ගෙවනු ලැබිය හැකි බැංකු අයිරා රහිත ශුද්ධ අගයන්හී වෙනස්කම්වල සැලකිය නොහෙන අවදානමට යටත් මුදල් ශේෂ, නිවේදන තැන්පතු, ඉල්ලුම් තැන්පතු හා කෙටි කාලීන අධිද්‍රවශීල ආයෝජන වලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

### 3.2.7 මුදල් නොවන වත්කම් හායනය

සෑම වාර්තා කෙරෙන දිනකම යම් දේපළක් හායනය වීමේ තත්ත්වයක් පෙන්නුම් කරන්නේ දැයි සංස්ථාව මගින් තක්සේරු කෙරේ. එවැනි පෙන්නුම් කිරීමක් පවතීනම් හෝ යම් දෙපළක වාර්ෂික හායනය වීමේ පරීක්ෂාව අවශ්‍ය විටදී සංස්ථාව විසින් එම වත්කමෙන් අය කරවා ගත හැකි වටිනාකම තක්සේරු කෙරේ. භාවිතයේදී වත්කමේ වටිනාකම සහ විකිණීමට වන වැය අඩු කළ එහි සාධාරණ මිල අතරින් වැඩි මුදල වත්කමේ අයකරවා ගත හැකි ප්‍රමාණය ලෙස සැලකේ. එය එක් එක් වත්කමට වෙන් වශයෙන් ගණනය කෙරේ. එම වත්කමින් අනිකුත් වත්කම් හා වත්කම් කාණ්ඩයකින් නිදහස්ව ස්වාධීන මුදල් ගලනයක් උත්පාදනය නොවන්නේ නම් එක් එක් වත්කමට වෙන් වශයෙන් ගණනය කෙරේ. යම් වත්කමක ඉදිරියට ගෙන යන අගය, එයින් අයකරවා ගත හැකි අගයට වඩා වැඩි වේ නම් එම දේපළ හායනය වූ ලෙසට සලකා එයින් අයකරවා ගත හැකි අගයට සටහන් කෙරේ. භාවිත අගය තක්සේරු කිරීමේදී, මුදලේ කාලීන අගය සහ එම වක්තමට විශේෂිත වූ අවදානම පෙන්නුම් කරන පෙරබදු වට්ටම් අගයන් ලෙසට ඉදිරි මුදල් ගලනයන් වට්ටම් කෙරේ.

විකුණුම් පිරිවැය අඩුකළ සාධාරණ මිල ගණනය කිරීමේදී මෑතක සිදුකළ වෙළඳ පොළ ගනුදෙනු සැලකිල්ලට ගැනේ. එබඳු ගනුදෙනු හඳුනාගත නොහැකි නම් ප්‍රමාණවත් ඇගැයීමේ ආකෘතියක් යොදා ගැනේ.

ක්‍රියාත්මක වන මෙහෙයුම් තුළ හායනය වීමේ අලාභ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනෙනුයේ එසේ දුබලතත්වයට පත් වත්කමෙහි ක්‍රියාකාරිත්වය අනුගත වන්නාවූ වියදම් කාණ්ඩ තුළය.

අවසාන වරට හායනය වීමේ පාඩුව හඳුනාගැනීමට අනතුරුව, වත්කමේ අයකර ගත හැකි වටිනාකම ගණනය කිරීමේදී භාවිතා කළ තක්සේරුවේ යම් වෙනසක් වී ඇත්නම් පමණක් කලින් හඳුනාගත්

දුබලතා පාඩුව ප්‍රත්‍යාවර්තනය කෙරේ. එවැනි අවස්ථාවකදී වත්කමේ ඉදිරියට ගෙන යන අගය අයකරවා ගත හැකි අගයට ඉහළ දැමේ. එම වත්කම පිළිබඳව පෙර වර්ෂ තුළ කිසිදු හායන පාඩුවක් හඳුනාගෙන නොතිබුණේ නම් ශුද්ධ ක්ෂය වීම තීන්දු කෙරෙන ඉදිරියට ගෙන යන අගය මෙම ඉහළ දැමූ අගයට වඩා වැඩි නොවිය යුතුය. එවැනි ප්‍රත්‍යාවර්තනවිස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

## 3.3 මූල්‍ය මෙවලම්

### 3.3.1 මූල්‍ය වත්කම්

#### 3.3.1.1 මූලික පිළිගැනීම හා මිණුම්

ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති අංක 39 විෂය පථය තුළ පවතින මූල්‍ය වත්කම් ලාභ හෝ පාඩු, ණය හා ලැබිය හැකි, කල් පිරෙන තෙක් රඳවා ඇති ආයෝජන, අලෙවි කළ හැකි මූල්‍ය වත්කම් හෝ බල සහිත හෙජ් ගිවිසුමක හෙජින් උපකරණයක් ලෙසට නියම කරන ලද ව්‍යුත්පන්න තුළින් සාධාරණ මිලට පවතින මූල්‍ය වත්කම් මූලික හඳුනා ගැනීමේදී සංස්ථාව තම මූල්‍ය වත්කම් වල වර්ගීකරණය නිශ්චිත කර ගනී.

සෑම වත්කමක්ම මූලිකව සාධාරණ මිලට වඩා වැඩි ලෙසට පිළිගන්නා අතර, එසේ නොවන වත්කම් ලාභ හා පාඩු මගින් සෘජුව ආරෝපනීය ගණුදෙනු කළ හැකි මිලට හඳුනා ගනී. වෙළඳ පොළෙහි පවතින රෙගුලාසි හෝ සම්මුති (නිත්‍ය අලෙවි ක්‍රමය) අනුව කාල පරාසයක් තුළදී ලබා දිය යුතු වන මූල්‍ය වත්කම් මිලදී ගැනීමේදී හා අලෙවි කිරීමේදී එම වත්කම මිලදී ගැනීම් හෝ විකිණීමට නියම කිරීම් දිනට සංස්ථාව විසින් පිළිගනු ලැබේ.

සංස්ථාවේ මූල්‍ය වත්කම් තුළ මුදල් හා මුදල් සමාන දෑ ද, කෙටි කාලීන තැන්පතු, වෙළඳ හා වෙනත් ලැබිය හැකි දේද, ණය මුදල් හා මිල ආරෝපිත හිමිකම් මෙවලම්ද අඩංගු වේ.

#### 3.3.1.2 තදන්තර මානනය

මූල්‍ය වත්කම්හී පසු මානනය පහත විස්තර කෙරෙන වර්ගීකරණය මත රඳා පවතී.

#### 3.3.1.3 ලාභ හෝ පාඩු මගින් සාධාරණ අගයට මූල්‍ය වත්කම්

අලෙවිය සඳහා දරා සිටින මූල්‍ය වත්කම් සහ ලාභ හෝ පාඩු තුළින් සාධාරණ අගයට මූලික හඳුනා ගැනීමක නියම කරන ලද මූල්‍ය වත්කම්, ලාභ හෝ පාඩු තුළින් සාධාරණ මිල දරන මූල්‍ය වත්කම් තුළ අඩංගු වේ. සමීප කාල සීමාවක් තුළ අලෙවිය දරා සිටින මූල්‍ය වත්කම් ලෙසට වර්ග කෙරේ. ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති අංක 39 මගින් නිර්වචනය කෙරෙන හෙජින් ගනුදෙනුවකදී උපකරණයක් ලෙසට නම් නොකරන ලද සංස්ථාව ඇතුළත්වී ඇති ව්‍යුත්පන්න මූල්‍ය උපකරණද මෙම ප්‍රභේදයට ඇතුළත් වේ. බලාත්මක හෙජින් උපකරණ ලෙසට නම් කිරීමකට අයත් නොවන වෙන් කළ, නිහිත කරන ලද ව්‍යුත්පන්නද අලෙවිය සඳහා දරා සිටින වත්කම් ලෙසට වර්ග කෙරේ. ලාභ හෝ පාඩු තුළින් සාධාරණ අගයට පවතින මූල්‍ය වත්කම් ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායම හෝ මූල්‍ය වැය ලෙසට පිළිගැනෙන සාධාරණ අගයේ වෙනස්කම් සහිතව මූල්‍ය තත්වය ප්‍රකාශයේ අඩංගු වේ.

මෑත කාලයේ අලෙවි කිරීමේ බලාපොරොත්තුව තවදුරටත් අනුයෝජන වේද නැද්ද නොතකා සංස්ථාව තම මූල්‍ය වත්කම් ලාභ හෝ පාඩු (අලෙවිය සඳහා දරා සිටින) තුළින් සාධාරණ මිලට අගය විනිශ්චය කෙරේ. අක්‍රීය වෙළඳපොළ හේතුවෙන් සංස්ථාවට අනාගත බලාපොරොත්තුවක්

තබා ගැනීමට සැලකිය යුතු පරිදි අපහසු වීම සමග කළමනාකරණයේ අනාගත බලාපොරොත්තුව තුළ සිදුවන සැලකිය යුතු වෙනස් වීම අනුව තත්වය දුර්ලභ වන අවස්ථාවලදී එම මූල්‍ය වත්කම් ප්‍රතිවර්ග කිරීමට තීරණය කළ හැක. එම ප්‍රතිවර්ග කිරීම ණය හා ලබාගත හැකි ලෙසට අලෙවිය සඳහා ඇති හෝ පරිනතිය තෙක් දරා සිටින ලෙසට වර්ග කිරීම වත්කමේ ස්වභාවය අනුව සිදුවනු ඇත.

### 3.3.1.4 පරිනතිය තෙක් දරා සිටින මූල්‍ය වත්කම්

ණය සුරැකුම් පරිනතිය තෙක් දරා සිටීමේ ධනාත්මක අපේක්ෂාව සංස්ථාව සතුවේ නම් එවන් මූල්‍ය වත්කම් පරිනතිය තෙක් දරා සිටින වත්කම් ලෙසට වර්ග කෙරේ. එවන් වත්කම් මූලිකව සාධාරණ මිලට එකතු කළ සෘජු ආරෝපනීය ගනුදෙනු බැර අගයට පිළි ගැනේ. මූලික පිළිගැනීමට අනතුරුව පරිනතිය තෙක් දරා සිටින මූල්‍ය වත්කම් කාලීන ණය නිදහස් ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කිරීම බලාත්මක පොළී ක්‍රමය අඩුකළ දුබලත්වයට පත්වීමේ පාඩු ක්‍රමයට සිදු කෙරේ.

කාලීන ණය නිදහස් කිරීමේ පිරිවැය, ගණනය කිරීමේදී පවරාගැනීම මත වට්ටම් හෝ වාරික බලාත්මක පොළී අනුපාතයෙහි සම්පූර්ණ කොටසක් වන අයකිරීම් හෝ පිරිවැය ද සැලකිල්ලට ගැනේ. ක්‍රියාත්මක පොළී අනුපාත ක්‍රමක්ෂය ආදායම් ප්‍රකාශයෙහි මූල්‍ය ආදායම තුළ හඳුනා ගැනේ. වත්කම් දුබලත්වයට පත්වීමෙන් උද්ගතවන පාඩු ආදායම් ප්‍රකාශයෙහි මූල්‍ය පිරිවැය තුළ හඳුනා ගැනේ. ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැයෙහි අපවය වීම තුළින් සිදුවන පාඩු පිළිගැනීම සිදුවේ.

### 3.3.1.5 ණය සහ ලැබිය යුතු දෑ

ක්‍රියාකාරී වෙළඳ පොළක උපුටා දැක්වීමක් නොමැති ස්ථිර හෝ නිශ්චයනීය ගෙවීම් සහිත වත්කම් ණය හා ලබාගත හැකි වත්කම් ලෙස සැලකේ. එවන් මූල්‍ය වත්කම් සාධාරණ අගයට එකතු කළ සෘජුව ආරෝපනීය ගණුදෙනු පිරිවැයට අගය කෙරේ. මූලික පිළිගැනීමට අනතුරුව ණය සහ ලබා ගත හැකි දෙය බලාත්මක පොලී ක්‍රමය භාවිතා කර ගණනය කර ප්‍රබලත්වයට පත් වීමේ අලාභ අඩු කෙරේ. මුදල් හා මුදල් සාම්‍යයන් අලෙවිය සහ වෙනත් ලබා ගත හැකි දෑ ණය සහ ලබා ගත හැකි දෑ තුළ අඩංගු වේ.

### 3.3.1.6 අලෙවිය සඳහා ඇති මූල්‍ය වත්කම්

අලෙවිය සඳහා ඇති මූල්‍ය වත්කම් ව්‍යුත්පන්න නොවන ඉහත ප්‍රභේදයන් තුළ මූල්‍ය වත්කම් ලෙසට වර්ග නොකළ වත්කම් වේ. මූලික පිළිගැනීමට අනතුරුව සාධාරණ අගය එකතු කළ සෘජුව ආරෝපනීය ගණුදෙනු පිරිවැයට පිළිගැනේ. සාධාරණ අගය සහ එහි වෙනස්වීම අනුව නිර්දේශ කිරීම දුබලත්වයට පත්වීමේ පාඩු හා විදේශ මුදල් අගය වෙනස්කම් අලෙවිය සදහා ඇති මූල්‍ය වත්කම් වලට බලපෑම වෙනත් විස්තරාත්මක ආදායම් තුළ පිළිගැනීම සහ හිමිකම් ප්‍රකාශය තුළ සාධාරණ මිල සංචිතයේ ඉදිරිපත් කෙරේ. යම් ආයෝජනයක් පිළිනොගැනීමට ලක්වූවිට හිමිකම් ප්‍රකාශයේ එකතු වූ ලාභ හෝ පාඩු නැවත ලාභ හෝ පාඩු ලෙසට වර්ගීකරණය කෙරේ. අලෙවිය සඳහා ඇති මූල්‍ය වත්කම් හිමිකම් සුරැකුම්පත් සහ ණය සුරැකුම්පත් වලින් සමන්විතවේ.

අලෙවිය සදහා දරා සිටින මූල්‍ය වත්කම් සංස්ථාව මගින් අගය විනිශ්චය කිරීම තුළින් එය ඉදිරි කාලයේ අලෙවි කිරීමේ බලාපොරොත්තුව තවදුරටත් සුදුසු දැයි නිගමනය කෙරේ. අක්‍රීය වෙළඳපොළ තුළ මෙම වත්කම් අලෙවි කිරීමට සංස්ථාව අපහසුවීම අනුව කලමනාකරණය ඉදිරි කාලය තුළ අලෙවි කිරීම සැලකිය යුතු ලෙසට වෙනස්වේ. දුර්ලභ වාතාවරණයක් තුළදී මෙම මූල්‍ය වත්කම්

නැවත වර්ග කිරීමට සංස්ථාවට තෝරාගත හැක. ණය හා ලබාගත හැකි දෙය ප්‍රතිවර්ගීකරණය, අලෙවිය සඳහා සූදානම් හෝ කල් පිරෙන තෙක් රඳවා සිටීම වත්කමේ ස්වභාවය මත තීරණය වේ. පරිනතිය තෙක් දරා සිටින වර්ගය ප්‍රතිවර්ගීකරණය කිරීමට අවසර ලැබෙන්නේ ඒ ආකාරයටය. එසේ අවසර ලැබෙන්නේ, එම මූල්‍ය වත්කම් රඳවා ගැනීමේ හැකියාව හා අපේක්ෂා සහගත භාවය සතු නම් පමණි.

අලෙවිය සඳහා ලබාගත හැකි ප්‍රභේදය තුළින් ප්‍රතිවර්ගීකරණය කරන ලද වත්කම් සඳහා එම වත්කම මත මීට පෙර ඇති වූ ලාභය හෝ පාඩුව හිමිකම් තුළ පිළිගැනීමට ලක්ව ලාභ හෝ පාඩු තුල ක්‍රමක්ෂය භාවිතාකර එම ආයෝජනයේ ඉතිරි කාලය තුළ සිදු කෙරේ. නව ක්‍රමක්ෂය පිරිවැය සහ අපේක්ෂිත මූල්‍ය ගලනය අතර වෙනස ද සඵල පොලී අනුපාතය භාවිතයෙන් වත්කමේ ඉතිරි කාල සීමාව තුළ ක්‍රමක්ෂය කෙරේ. ඉන් අනතුරුව එම වත්කම දුබලත්වයට පත්වී ඇතැයි හඳුනාගැනීමේදී කොටස් හිමිකම්හී සඳහන් මුදල ආදායම් ප්‍රකාශයට ප්‍රතිවර්ග කෙරේ.

### 3.3.1.7 නොපිළිගැනීම

යම් මූල්‍ය වත්කමක් (හෝ යම් මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන වත්කම් කාණ්ඩයක කොටසක් හෝ අදාළ වන අවස්ථාවක දී) නොපිළිගැනීම සිදුවන්නේ:

- එම වත්කමෙන් මුදල් ප්‍රවාහය ලැබීමේ අයිතිය අවසන්වන විට දීත්;
- එම වත්කමෙන් මුදල් ප්‍රවාහය ලැබීමේ අයිතිය පවරාදීම හෝ යම් එකඟවීමකට අනුව තුන් වැනි පාර්ශ්වයකට ලැබෙන මුදල් ප්‍රවාහය ප්‍රමාදයකින් තොරව මුළුමනින්ම ගෙවීමේ බැඳීමක් උපකල්පනය කිරීමේදීත්; සහ(අ) එම වත්කමේ සියලු හරවත් අවදානම් හා ප්‍රතිලාභ සංස්ථාව විසින් පවරා දීම (ආ) සංස්ථාව විසින් එම වත්කමේ හරවත් අවදානම් හෝ ප්‍රතිලාභ පවරාදීමක් හෝ රඳවා ගැනීමක් කර නැතත් වත්කමේ පාලනය පවරාදීම තුළ දීත් ය.

සංස්ථාව වත්කමකින් මුදල් ප්‍රවාහ ලබා ගැනීම සඳහා එහි අයිතිය පවරා ඇති විට හෝ කිසියම් සංක්‍රාන්තික වැඩපිළිවෙළකට එළැඹී සිටින විට සහ වත්කමේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස පැවරීම හෝ රඳවා තබා ගැනීම හෝ එය පාලනය කිරීම පැවරීම නොකළ විට, ඊට සංස්ථාවේ අඛණ්ඩ මැදිහත්වීමේ ප්‍රමාණය මත අදාළ වත්කම හඳුනා ගැනේ. එම තත්වයේදී සංස්ථාව එය ආශ්‍රිත වගකීම් පිළිගනී.පැවරූ වත්කම් සහ ඒ ආශ්‍රිත වගකීම් මනිනු ලබන්නේ සංස්ථාව රඳවාගෙන ඇති අයිතිවාසිකම් සහ බැඳීම් පිළිබිඹු කරන පදනමක් මත ය. පැවරූ වත්කම පිළිබඳ ඇපකරයක ස්වරූපය ගන්නා අඛණ්ඩ මැදිහත්වීම වත්කම්වල රැගෙන යන මුල් මුදලට වඩා පහළින් මනිනු ලබන අතර සංස්ථාවට ආපසු ගෙවීමට අවශ්‍ය විය හැකි උපරිම සලකා බැලීමේ ප්‍රමාණය එමගින් මනිනු ලැබේ.

### 3.3.1.8 මූල්‍ය වත්කම්හි හායනය

යම් වත්කමක් හෝ වත්කම් සමූහයක් දුබලත්වයට පත් විය හැකි කිසියම් විෂයීක තත්වයක් පෙන්නුම් කරන්නේදැයි යන්න සෑම වාර්තා කරන දිනකම සංස්ථාව මගින් තක්සේරු කරනු ලැබේ. යම් වත්කමක් හෝ වත්කම් සමූහයක් දුබලත්වයට පත් විය හැකි යැයි සැලකෙන්නේ, සිදු වූ එක් සිද්ධියක් හෝ සිද්ධි කිහිපයක ප්‍රතිඵලයක් ලෙසට පැහැදිලි සාක්ෂි ඇත්නම් පමණි. වත්කමේ මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව එම පාඩු සිදුවීම, එම වත්කමේ හෝ සමූහයේ අනාගත තක්සේරු මූල්‍ය ගලනයට ඇති වන බලපෑම විශ්වාසවන්ත ලෙස තක්සේරු කළ හැක. දුබලත්වයට පත් වීමේ

සාක්ෂි තුළ, ණයකරුවන් හෝ ණයකරුවන් සමූහයක් සැලකිය යුතු මූල්‍ය අපහසුතා අත්විඳී නම් ඊට පොළී හෝ මූලධනය ගෙවීම පැහැර හැරීම හෝ අපචාරිය බව, ඔවුන් වස්තු භංගත්වයට හෝ මූල්‍ය ප්‍රතිසංවිධානයන්ට යොමුවීම, විමර්ශනය කළහැකි තොරතුරු මගින් තක්සේරු කළ අනාගත මූල්‍ය ගලනයේ පෙන්නුම් කරන හිඟ මුදල්, ආර්ථික තත්ව සම්බන්ධ වන පැහැර හැරීම් ඇතුළත් වන්නේය.

### 3.3.1.9 ක්‍රමක්ෂය පිරිවැයට අනුව ඉදිරියට ගෙනයන මූල්‍ය වත්කම්

ක්‍රමක්ෂය පිරිවැයට ඉදිරියට ගෙනයන මූල්‍ය වත්කම් පිළිබඳ සංස්ථාව පළමුව තක්සේරු කරන්නේ තනි තනිව සැලකිය යුතු වන මූල්‍ය වත්කම් නැතහොත් එසේ තනි තනිව සැලකිය යුතු නොවන මූල්‍ය වත්කම් සම්බන්ධව දුබලත්වයට පත් වීමේ අරමුණුදායක සාක්ෂි නොමැති බව සංස්ථාව හඳුනා ගතහොත්, එය සැලකිය යුතු හෝ එසේ නොමැති වුව ද ඒ හා සමාන බැර අවදානම් ගුණාංග පවතින මූල්‍ය වත්කම් කණ්ඩායමකට එකී වත්කම් ද ඇතුළත් කර සමූලිකව දුබලත්වයට පත් වීම සඳහා තක්සේරු කෙරේ. දුබලත්වයට පත් වීමේ පාඩුවක් සහිත දැනට පවතින වෙන් වශයෙන් දුබලත්ව තක්සේරුවට ලක්කරන හඳුනා ගත් වත්කම් දුබලත්වයට පත් වීමේ සමූලික තක්සේරුව ට ඇතුළත් නොකෙරේ.

දුබලත්වයට පත් වීමේ පාඩුවක් දරා ඇති බවට අරමුණුදායක සාක්ෂි ඇත්නම් එකී පාඩුවේ ප්‍රමාණය වත්කමේ පවතින අගය සහ මෙතෙක් ගණනය නොකළ හර පාඩු නොතකා තක්සේරු කළ ඉදිරි මූල්‍ය ගලනයේ පවතින අගය අතර වෙනස ලෙසට ගණනය කෙරේ. තක්සේරු කළ ඉදිරි මූල්‍ය ගලනයේ දැනට අගය, එකී මූල්‍ය වත්කමේ මුල් ක්‍රියාත්මක පොලී අනුපාතයට වට්ටම් කෙරේ. ණය මුදලක් සම්බන්ධව වෙනස්වන පොළී අනුපාතයක් ඇත්නම් යම් දුබලත්වයට පත් වීමේ අලාභය ගණනය කිරීමේ දී දැනට පවතින පොළී අනුපාතය අදාළ වේ. දීමනා ගිණුමක් භාවිතය තුළින් වත්කමේ ඉදිරියට ගෙනයන අගය අඩුකර පාඩුවේ ප්‍රමාණය ලාභ හා පාඩු වාර්තාවේ පිළිගැනේ. අඩුකළ ගෙනයන ප්‍රමාණයට පොලී ආදායම එකතු කිරීම පවතින අතර, දුබලත්ව අලාභය ගණනය කිරීම සඳහා ද ඉදිරි මූල්‍ය ගලනය වට්ටම් කිරීම සඳහා භාවිතා කරන පොලී අනුපාතය ඒ සඳහා භාවිතා කෙරේ. මූල්‍ය වාර්තාවේ මූල්‍ය ආදායමේ කොටසක් ලෙසට පොලී ආදායම වාර්තා කෙරේ. සියලු සමපාර්ශ්විය අයකිරීම් ලබාගැනීමෙන් පසු ඉදිරියේ දී යථාර්ථ නිරූපිත අපේක්ෂා නොමැති තත්වයේ දී ණය මුදල් ලියා අත්හරී. දුබලත්වයට පත් වීම හඳුනාගැනීමෙන් අනතුරුව ඇතිවූ සිදුවීමක් හේතුවෙන් ඇස්තමේන්තු දුබලත්ව පාඩුව වැඩිවීම් හෝ අඩුවීම් ඉන් පසු වර්ෂයක දී සිදුවුවහොත්, කලින් හඳුනාගත් දුබලත්ව පාඩුව දීමනා ගිණුම සැකසීම මගින් අඩුකිරීම හෝ වැඩිකිරීම සිදුකෙරේ. අනාගතයේ ලියා අස්කරන ලද්දක් පසුව යථා තත්වයට පත්වුවහොත් ලාභ හා පාඩු වාර්තාවේ මූල්‍ය පිරිවැයට එය බැර කෙරේ.

### 3.3.2 මූල්‍ය වගකීම්

### 3.3.2.1 මූලික හදුනාගැනීම සහ මානනය

ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති අංක 39 හි විෂය පථයට ඇතුලත් වන මූල්‍ය වගකීම් ගැළපෙන ආකාරයට ලාභ හා පාඩු ණය සහ ණය ලබා ගැනීම් ක්‍රියාත්මක හෙජින් ගිවිසුමක නියම කල ව්‍යුත්පන්න තුලින් සාධාරණ මිලට පවතින මූල්‍ය වගකීම් ලෙසට වර්ග කෙරේ. මූලික පිළිගැනීමේදී සංස්ථාව තම මූල්‍ය වගකීම් වර්ග හඳුනා ගනී. සියලුම මූල්‍ය වගකීම් ප්‍රථමයෙන් සාධාරණ මිලට හඳුනා ගැනීමද, ණය සහ ණය ලබා ගැනීම ඉදිරියට ගෙන යාම ක්‍රමක්ෂය පිරිවැයටද වේ. මෙයට සෘජුව ආරෝපනීය

ගනු දෙනු තුළපිරිවැයද අඩංගුය.වෙළඳ හා වෙනත් ගෙවිය යුතු බැංකු අයිරා, ණය සහ ණය ලබා ගැනීම් සංස්ථාවේ මූල්‍ය වගකීම් වේ.

### 3.3.2.2 තදන්තරමානනය

මූල්‍ය වගකීම් නිර්දේශ පහත ආකාරයට වර්ග කිරීම මත රැඳේ.

### 3.3.2.3 ලාභ හෝ පාඩු තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කම්

ලාභ හෝ පාඩු තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් තුළ අලෙවිය සඳහා රඳවාගෙන සිටින මූල්‍ය වගකීම්, සහ ලාභ හෝ පාඩු තුළින් ප්‍රථමයෙන්ම සාධාරණ මිලට නම්කර ඇති මූල්‍ය වගකීම් ද අඩංගු වේ. මෑත කාලයේදී අලෙවිය සඳහා අත්කරගෙන ඇත්නම් මූල්‍ය වත්කම අලෙවිය සඳහා දරා සිටින ලෙසට වර්ග කෙරේ. ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති අංක 39 මගින් නිර්වචනය කෙරෙන හෙජ් සම්බන්ධතාවයකදී හෙජින් උපකරණ ලෙසට නියම නොකළ කණ්ඩායමට ඇතුලත් කල මූල්‍ය උපකරණ මෙම ප්‍රභේදය තුළ අඩංගු වේ. බලාත්මක හෙජින් උපකරණ ලෙසට නම් නොකළ වෙන්කළ නිහීන ව්‍යුත්පන්නද අලෙවිය සඳහා දරා සිටින ලෙසට වර්ග කෙරේ.

අලෙවිය සඳහා දරා සිටින වගකීම මත ඇතිවන ලාභ හෝ පාඩු පිළිගැනීමට ලක්වේ. මූලික පිළිගැනීම අනුව සංස්ථාව මගින් කිසිදු මූල්‍ය වගකීමක් ලාභ හෝ පාඩු තුළින් සාධාරණ මිලට පවතින ලෙසට නියම කර නැත.

### 3.3.2.4 ණය මුදල් හා ණය ගැනුම්

මූලික පිළිගැනීමෙන් පසුව පොලී දරන ණය මුදල් සහ ණය ගැනුම් සඵල පොලී අනුපාත ක්‍රමය යොදාගනිමින් ක්‍රමක්ෂය පිරිවැයට අනුව පසුව මානනය කෙරේ. බැරකම් පිළිනොගන්නා විට මෙන්ම සඵල පොලී අනුපාත ක්‍රමයේ ක්‍රමක්ෂය ක්‍රියාවලිය ඔස්සේ ද ආදායම් ප්‍රකාශයෙහි ලාභ සහ අලාභ හඳුනා ගැනේ.පවරා ගැනීම මත යම් වට්ටමක් හෝ වාරිකයක් සහ සඵල පොලී අනුපාතයෙහි හි සමස්ත කොටසක් වන අය කිරීම හෝ පිරිවැය සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කෙරේ. ආදායම් ප්‍රකාශයෙහි මූල්‍ය පිරිවැයේ සඵල පොලී අනුපාතයේ ක්‍රමක්ෂය අඩංගු කෙරේ.

### 3.3.2.5 පිළි නොගැනීම

බැරකම් යටතේ පවතින බැඳීම් ඉටු කිරීම, අවලංගු කිරීම හෝ අවලංගු වීම අනුව යම් මූල්‍ය බැරකමක් පිළි නොගැනීමට ලක් වේ. පවතින මූල්‍ය බැරකමක් එම ණයදායකයාගෙන් හරවත් ලෙසට වෙනස්වූ අනුදේශ හෝ හරවත් ලෙසට වෙනස් කළ පවතින බැරකම් මත පවතින මූල්‍ය බැරකමක් අනුයෝග කළ විට එවන් හුවමාරුවක් හෝ වෙනස් කිරීම මුල් බැරකම පිළි නොගැනීමක් ලෙසට සැලකෙන අතර නව බැරකම පිළිගැනීමක් වේ. එහි අදාළ වත්කම් ප්‍රමාණයන්ගේ වෙනස ආදායම් ප්‍රකාශයේ පිළිගැනීමට ලක්වේ.

### 3.3.2.6 නීත්‍යානුකූල මූල්‍ය මෙවලම් හිලව් කිරීම

පිළිගත් මුදල් හිලව් කිරීම සඳහා ක්‍රියාත්මක කළ හැකි නෛතික අයිතියක් පවතී නම් සහ දළ පදනමක් මත ණය පියවීමට හෝ වත්කම් විකුණා බැරකම් සමගාමීව බේරුම් කිරීමේ චේතනාව පවතීනම් මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් හිලව් කිරීම සහ දළ මුදල් ප්‍රමාණය මූල්‍ය තත්ව ප්‍රකාශයේ වාර්තා කිරීම සිදු කෙරේ. සංස්ථාවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති තුළ විශේෂිතව එළිකර ඇති ආකාරයට,

යම් ගිණුම් ප්‍රතිපත්තියක්, හෝ අර්ථ විවරණයක් මගින් අවශ්‍යතාවය හෝ අවසර ලබාදීමක් නොමැති නම් ආදායම් ප්‍රකාශයේ අදායම් සහ වියදම් හිලව් කිරීමක් නොවනු ඇත.

### 3.3.2.7 මූල්‍ය මෙවලම්හි සාධාරණ මිල

එක් එක් වාර්තාකරණ දිනයන්හි සක්‍රීය වෙලඳපොළවල වෙළඳාම් කරන මූල්‍ය උපකරණවල සාධාරණ වටිනාකම තීරණය කරනු ලබන්නේ, ගණුදෙනු පිරිවැය සඳහා කිසිදු අඩු කිරීමකින් තොරව, ඉදිරිපත් කර දක්වන ලද වෙළඳ මිල ගණන් හෝ අලෙවි නියෝජිත මිල ගණන් පිළිබඳ (දිගු අවස්ථා සඳහා ලංසු මිල සහ කෙටි අවස්ථා සඳහා ඇසුම් මිල වශයෙන්) කරුණු ඇසුරෙන් කටයුතු කිරීමෙනි.

සක්‍රීය වෙළඳපළක වෙළඳ කටයුතු නොකරන මූල්‍ය උපකරණ සඳහා, සුදුසු තක්සේරු ක්‍රම භාවිතා කර සාධාරණ වටිනාකම තීරණය කරනු ලැබේ. එවැනි තාක්ෂණික විධි තුළ පහත දැක්වෙන ලක්ෂණ ඇතුළත් විය හැකි ය:

- මෑතක සිදුවූ අතේ දුර වෙළඳපොළ ගනුදෙනු යොදාගැනීම;
- ප්‍රමාණවත් ලෙසට සමාන වෙනත් උපකරණයක පවතින සාධාරණ මිලට යොමුව කටයුතු කිරීම;
- වට්ටම් කළ මූල්‍ය ගලන විශ්ලේෂණය හෝ වෙනත් ඇගැයීමේ මාදිලි.

මූල්‍ය මෙවලම් සාධාරණ අගය පිළිබඳ විශ්ලේෂණයක් සහ ඒවා ගණනය කරන ආකාරය පිළිබඳ තවදුරටත් විස්තර කිරීමක් සටහන් අංක 23 හි ලබා දී ඇත.

## 3.4 පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ

### 3.4.1 නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම

පුරෝකථනමය ඒකක ණය ක්‍රමය භාවිතාකර රපෝර්තු දිනට පවතින නිශ්චිත ප්‍රතිලාභ බැඳියාවෙහි පවතින වත්කම මූල්‍ය තත්වයේ පිළිගන්නා බැරකම් වේ. පාරිතෝෂිත බැරකමට බාහිරව සදාතන නොවන දැනට පවතින නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම වෙත ලඟාවීමට අවශ්‍ය උපකල්පනයන් සැලකිල්ලට ගනිමින් පුරෝකථනමය ඒකක ණය ක්‍රමයභාවිතා කර පාරිතෝෂිත බැරකම ඇගැයීම සිදු කෙරේ.

කෙසේ වුවද, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනතට අනුව සේවකයෙකු හට පාරිතෝෂික ගෙවීමේ අවශ්‍යතාවය ඇති වන්නේ වසර පහක අඛණ්ඩ සේවය සම්පූර්ණවීමෙන් පසුවය.

### 3.4.2 නිශ්චිත දායකත්ව සැලැස්ම - සේවක අර්ථ සාධක අරමුදල හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල

නිශ්චිත දායකත්ව සැලැස්මක් යනු එක් ආයතනයක් විසින් තවත් ආයතනයක් වෙත පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ සැලැස්මක් යටතේ ස්ථාවර දායක මුදල් ප්‍රමාණයක් ගෙවීමේ ක්‍රියාදාමය වන අතර ඒ සඳහා තවදුරටත් පසුව මුදල් ගෙවීම පිණිස නෛතික හෝ සම්ප්‍රයුක්ත බැඳීමක් නොපවතී. සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට හිමිකම් ලබන සියලුම සේවක සේවිකාවෝ ඊට අදාළ අණපනත් අනුව අදාළ දායකත්ව අරමුදල මගින් ආවරණය වන්නාහ. නිශ්චිත දායකත්ව අරමුදලට සේවා යෝජක විසින් කරනු ලබන දායක මුදල් ඒවා දරනු ලබන අවස්ථාවේදී ලාභ හෝ අලාභ තුළවියදම් ලෙස හඳුනා ගැනේ.

## 3.5 ප්‍රතිපාදන, අවිනිශ්චිත බැරකම් සහ අවිනිශ්චිත වත්කම්

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් සංස්ථාව සතුව වර්තමානයෙහි බැඳියාවක් (නෛතික හෝ සම්ප්‍රයුක්ත) පවත්නා විටෙක ආර්ථික ප්‍රතිලාභ සමන්විත සම්පත්වල විගලනයක් අවශ්‍යව ඇති බවටත්, අදාළ බැඳියාව හා සම්බන්ධ මුදල් ප්‍රමාණයෙන් විශ්වාසදායක ඇස්තමේන්තුවක් සකසා ගත හැකි බවටත් අනුමාන කෙරෙන අවස්ථාවේදී ප්‍රතිපාදන හඳුනා ගැනේ. යම් ප්‍රතිපාදනයක ඇතැම් හෝ සියලු මුදල් ප්‍රමාණ ප්‍රතිපූර්ණය කිරීමට සංස්ථාව අපේක්ෂා කරන්නේ නම්, එකී ප්‍රතිපූර්ණය බොහෝ සෙයින් ස්ථිර වන විටෙක එය වෙනමම වත්කමක් ලෙස හඳුනා ගැනේ.

සම්පත් ගලායමින් ඉතා දුරස්ථතාවයක් නොවන්නේ නම් මිස සියලුම අසම්භාව්‍ය වගකීම් මූල්‍ය ප්‍රකාශන වල සටහන් වශයෙන් අනාවරණය කර ඇත.

ආර්ථික ප්‍රතිලාභවල ආගලනය අනුමාන වන්නා වූ කල්හී අවිනිශ්චිත වත්කම් හෙළිදරව් කෙරෙනු ඇත.

## 3.6 රාජ්‍ය ප්‍රදාන

සියලුම සහසම්බන්ධ කොන්දේසි සපුරා තිබෙන හා ලැබේය යන සාධාරණ තහවුරුවකින් යුතුව හා ප්‍රදානය වියදම් අයිතමයක් සඳහා අදාළ වන විට, පිරිවැය හා සැසඳීමට අදාළ වන වර්ෂයේ ආදායමක් වශයෙන් හඳුනාගතහැකි අවස්ථාවකදී හා එකී ප්‍රදානය මගින් වියදම් පූර්ණය වීමට බලාපොරොත්තුවන්නේද, ප්‍රදානය වත්කමක් සම්බන්ධ වන අවස්ථාවකදී විලම්බිත ආදායම් ගිණුමකට බැර කරන සාධාරණ වටිනාකම වත්කමේ බලාපොරොත්තු වන ප්‍රයෝජනවත් ආයුකාලය ආදායමට සමාන වාර්ෂික වාරික මගින් නිදහස් කිරීම තුළ රාජ්‍ය ප්‍රදාන වශයෙන් හඳුනාගනු ලැබේ. සංස්ථාවට මුල්‍ය නොවන ප්‍රදාන ලැබෙන අවස්ථාවලදී වත්කම හා ආදායම වාර්තා වනුයේ දළ සාමාන්‍ය වටිනාකමට අනුව හා එය ආදායම් ප්‍රකාශයට නිදහස් කරනුයේ එහි ප්‍රතිලාභ පාරිභෝජනය කරනු ලබන රටාවට අනුව සමාන වාර්ෂික වාරික මගිනි.

## 3.7 විස්තීරණ ආදායම් ප්‍රකාශ

### 3.7.1 ආදායම

සංස්ථාවේ සාමාන්‍ය කටයුතු තුළ වෙළෙඳ වට්ටම් හා විකුණුම් හා බැඳි බදු හැර භාණ්ඩ හෝ සේවා සැපයීම මගින් ලැබෙන්නාවූ වටිනාකම ආදායම මගින් නියෝජනය වේ.

#### 3.7.1.1 ආදායම් හඳුනා ගැනිම

ආර්ථික වටිනාකම ආයතනය තුළට ගලා ඒමේ විභවයකදී සහ ආදායම හා එයට අදාළ වියදම විශ්වාසනීයත්වයකින් යුතුව මැනිය හැකි වනතාක් දුරට එවැනි වටිනාකම ආදායම වශයෙන් හඳුනා ගැනේ. ආයතනයේ අභ්‍යන්තර විකුණුම් ඉවත් කර විකුණුම් සඳහා වු බදු හා වෙළෙද වට්ටම් හැර ලැබූ හෝ ලැබේ යැයි සැලකෙන්නා වු සාධාරණ වටිනාකම ආදායම ලෙස හඳුනා ගනු ලැබේ.ආදායම් හඳුනා ගැනීමේ අරමුණ සඳහා පහත සඳහන් නිශ්චිත නිර්ණායක භාවිතා කරනු ලැබේ.

##### 3.7.1.1.1 ඉදිකිරීම් කොන්ත්‍රාත්තු

කොන්ත්‍රාත්තුවක ඇස්තමේන්තුගත ආදායම විශ්වාසනීයව හඳුනා ගැනීමට වාර්තාකරන දිනට කොන්ත්‍රාත් කටයුතු නිමකළ ප්‍රතිශතගත අවස්ථාව වෙත යොමු වි ආදායම හඳුනා ගැනේ.

(ප්‍රතිශතගත නිමකළ ක්‍රමය) කොන්ත්‍රාත්තුවේ ආදායම විශ්වාසනීයව ඇස්තමේන්තු කළ නොහැකි අවස්ථාවකදී අඩංගු වන්නේ යැයි සැලකෙන්නාවූ හා අයකරගත යුතු සියලුම වියදම් කොන්ත්‍රාත් ආදායම ලෙස හඳුනා ගැනේ. එවැනි විටෙක මුළු වියදම මුළු ආදායමට සම වේ. වියහැකි පාඩු වහාම වියදම් වශයෙන් හඳුනා ගැනේ.

නිම කරනු ලබන අදියර මනිනු ලබන්නේ අද දින දක්වා ඉටු කරන ලද වැඩ සඳහා දරනු ලබන පිරිවැයට ඇස්තමේන්තු ගත මුළු පිරිවැය යන අනුපාතයට සැසදුම් දෙමිනි.

### 3.7.1.1.2 භාණ්ඩ විකුණුම්

සාමාන්‍ය කටයුතු වලදී භාණ්ඩ අලෙවියෙන් ලැබෙන හෝ ලැබේ යැයි සැලකෙන වෙළෙඳ වට්ටම් හා ප්‍රතිදාන අඩු කිරීමෙන් ලැබෙන ඵලය විකුණුම් මගින් වන සාධාරණ වටිනාකම ලෙස මැනගනු ලැබේ. විකුණු භාණ්ඩය පිළිබඳ ක්‍රියාත්මක පාලනයක් හෝ අයිතිය පිළිබඳව සාමාන්‍යයෙන් භාවිතා කෙරෙන ප්‍රමාණයේ කළමනාකරණ සම්බන්ධයක් සංස්ථාව රඳවා ගැනීමක් නොමැතිව භාණ්ඩ වල සැලකිය යුතු අවදානම හා අයිතිවාසිකම භාණ්ඩ මිලදී ගන්නා වෙත පැවරීම ඉටුකළ පසු භාණ්ඩ විකිණීමෙන් වන අදායම ලෙස හඳුනාගැනේ.

### 3.7.1.1.3 සේවාවන් පිරිනැමීම.

සියලුම සැලකිය යුතු අන්දමේ ක්‍රියාත්මක වගකීම් ඉටුකළ පසු විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ සේවාවන් පිරිනැම්මෙන් වන ආදායම ලෙස හඳුනා ගැනේ.

### 3.7.1.1.4 වෙනත් ආදායම්

දේපළ, යන්ත්‍ර හා උපකරණ බැහැර කිරීමෙන් ලැබෙන ආදායමින් එහි ධාරණ අගය හා අදාළ වියදම් අඩු කිරීමෙන් පසු වන ලාභ හෝ අලාභ වෙනත් ආදායම් ලෙස හඳුනා ගැනේ.

විදේශ විනිමය ලාභ හෝ පාඩු ශුද්ධ පදනමට ගැනේ.

සාමාන්‍යයෙන් භාණ්ඩ ප්‍රවාහනයෙන් භාණ්ඩ අයිතියේ අවදානම හා ප්‍රතිලාභ පැවරෙන පරිදි සුන්බුන් විකුණුමෙන් ආදායම් හඳුනා ගැනේ.

### 3.7.1.1.5 පොලී ආදායම

ක්‍රමක්ෂය පිරිවැයට අනුව මානනය කරන ලද සියලුම මුල්‍ය පිරිවැය ප්‍රමාණද, අලෙවිය සඳහා පවතින්නේය යනුවෙන් වර්ග කරන ලද පොලී දරන මුල්‍ය වත්කම් ප්‍රමාණද, පොලී ආදායම සහ වියදම් ද සඵල පොලී අනුපාතය යොදාගනිමින් සටහන් කරනු ලැබේ. එකී සඵල පොලී අනුපාතය වනුයේ, අදාළ මුල්‍ය වත්කමෙහි අපේක්ෂිත ආයු කාලය තුළ හෝ ඊට අඩු කාලයක් තුළ එහි ඇස්තමේන්තුගත අනාගත මුදල් ගෙවීම් හෝ ලැබීම් මත හෝ එසේ නොමැතිනම්, උචිත වන පරිදි අදාළ මුල්‍ය වත්කමෙහි හෝ බැරකමෙහි ඉදිරියට ගෙනයන ශුද්ධ වටිනාකම මත නියමාකාරවම වට්ටම්ගත කරනු ලබන අනුපාත ප්‍රමාණයයි.ආදායම් ප්‍රකාශයේ මුල්‍ය ආදායම තුළ පොලී ආදායම ඇතුළත් වේ.

## 3.7.2 වියදම් හඳුනාගැනිම

### 3.7.2.1 ඉදිකිරීම් කොන්ත්‍රාත්

අනාගතයේදී කොන්ත්‍රාත් ක්‍රියාවලිය සඳහා යම් වත්කම් ඇති කිරීමේදී හැර කොන්ත්‍රාත් වියදම් හඳුනාගැනෙනුයේ ඒවා දරනු ලැබ ඇතැයි යනුවෙන් සලකාය. කොන්ත්‍රාත්තුවක් මත අපේක්ෂිත වන්නා වූ පාඩුවක් ලාභ හෝ අලාභ තුළ වහා හඳුනා ගැනේ.

### 3.7.2.2 වෙනත් වියදම්

වර්ෂය සඳහා ලාභය තීරණය කිරීමේදී කාර්යක්ෂම තත්වයෙන් ව්‍යාපාරය පවත්වාගෙන යාමෙහිලා දරන ලද සහ දේපළ, පිරියත හා උපකරණ නඩත්තු කිරීමෙහිලා දරන ලද සියලුම වියදම් ආදායම වෙත අයගත කෙරේ. විස්තීර්ණ ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා සංස්ථාවේ කාර්ය සාධනය පිළිබඳ මූලාංග යුක්ති සහගත ලෙස වියදම් ක්‍රමය ආශ්‍රිත කෘත්‍යතාව විෂයෙහි නියෝජනය වන බවත්, ඒ අනුව එම ඉදිරිපත් කිරීමේ ක්‍රමය අනුගමනය කරනු ලැබ ඇති බවත් අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වන්නේය.

### 3.7.2.3 ණය ගැනුම් පිරිවැය

ඉදිකිරීම් හෝ ඉදිකිරීම් සංවර්ධනයේ කාල පරිච්ජේදය තුළ කිසියම් වත්කමක පිරිවැයෙහි කොටසක් ලෙස ප්‍රාග්ධනය කරනු ලබන දේපළ, පිරියත හා උපකරණ වල ඉදිකිරීම් හා ඉදිකිරීම් සංවර්ධනය ආශ්‍රිත කටයුතුවලට සෘජුවම හේතු කාරක වන ණය ගැනුම් පිරිවැය හැර අනෙකුත් පිරිවැය ඒවා දරනු ලබන කාලපරිච්ජේදයෙහි  සිදුවූ වියදමක් ලෙස අදාළ ණය ගැනුම් පිරිවැය තුළ හඳුනා ගනු ලැබේ.

### 3.7.3 බදුඅය කිරීම

### 3.7.3.1 ප්‍රවර්තන බදු

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවන අයකර ගැනීමට බලාපොරොත්තුවන මුදලට පවතින කාල සීමාව හා පෙර කාලසීමාව සදහා ආදායම් බදු බැරකම් නිර්දේශ කෙරේ. වාර්තා කෙරෙන දිනට පනවා ඇති හෝ ප්‍රමාණවත් ලෙසට පනවා ඇති බදුඅනුප්‍රමාණසහ බදු නීති භාවිතා කර බදු ප්‍රමාණය ආගනනය කෙරේ.

මූල්‍ය ප්‍රකාශයේ වාර්තා කෙරෙන ආදායම් මූලාංගයන් හා වියදම් පදනම් වූ ආදායම් බදු සදහා ප්‍රතිපාදන දේශීය ආදායම් පනතේ විධිවිධානයන් අනුව ආගනනය කෙරේ.

මූල්‍ය ප්‍රකාශයට කර ඇති සටහන් තුළ අදාළ තොරතුරු හෙලිදරව් කෙරේ.

### 3.7.3.2 විලම්බිත බදුකරණය

විලම්බිත බදුකරණය සම්පාදනය කෙරෙනුයේ, වත්කම්වල හා බැරකම්වල බදු පදනම සහ මූල්‍ය වාර්තාකරණයේ කාර්යයන් සඳහා ඒවායේ ඉදිරියට ගෙන යනු ලබන මුදල් ප්‍රමාණ අතර රපෝර්තු දිනට පවත්නා තාවකාලික වෙනස්කම් මත බැරකම් ක්‍රමවේදය යොදා ගනිමිනි. සියලුම තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිත බදු වත්කම් සහ බැරකම් හඳුනා ගනු ලැබේ. සියලුම අවකරණය කළ හැකි තාවකාලික වෙනස්කම් ද, යොදා නොගැනුණු බදු බැර සහ යොදා නොගැනුණු බදු අලාභවල ඉදිරියට ගෙනයාම්ද, ඒවා අවකරණයකළ හැකි තාවකාලික වෙනස්කම් එල්ලේ බදු වන ලාභයක් පවතින්නේය යනුවෙන් සහ යොදා නොගැනුණු බදු බැර සහ යොදා නොගැනුණු බදු අලාභවල ඉදිරියට ගෙනයාම් උපයෝජනය කරගත හැකි වෙතැයි යනුවෙන් අනුමාන කෙරෙන තාක් දුරකට, විලම්බිත බදු වත්කම් හඳුනා ගැනේ.

විලම්බිත බදු වත්කම් හා බැරකම් මානනය කරනු ලබන්නේ, රපෝර්තු කාලපරිච්ජේදයේ අවසානයට පනවා ඇති හෝ සැලකිය යුතු අයුරින් ප්‍රමාණවත් ලෙස පනවා ඇති බදු අනුප්‍රමාණ සහ බදු අණපනත්

මත පදනම්ව අදාළ වත්කම් උපලබ්ධි වන හෝ බේරුම් කරනු ලබන කල්හී නියමිත වර්ෂයට අදාළ කර ගැනීමට අපේක්ෂා කරනු ලබන බදු අනුප්‍රමාණ අනුවය. ජංගම බදු බැරකම් එල්ලේ ජංගම බදු වත්කම් නිරාකරණය පිණිස නීතිමය වශයෙන් බලාත්මක කළ හැකි අයිතිවාසිකමක් පවතී නම් හා අදාළ විලම්බිත බදු, බදු බැඳියාව දරන එම ව්‍යාපාරයටම සහ බදුකරණය හා සම්බන්ධ එම අධිකාරී ආයතනයටම අදාළ වන්නේනම්, අදාළ බදු වත්කම් හා විලම්බිත බදු බැරකම් හිලවු කිරීමට කටයුතු කරනු ලැබේ.

විලම්බිත බදුකරණය සම්පාදනය කෙරෙනුයේ, වත්කම්වල හා බැරකම්වල බදු පදනම සහ මූල්‍ය වාර්තාකරණයේ කාර්යයන් සඳහා ඒවායේ ඉදිරියට ගෙන යනු ලබන මුදල් ප්‍රමාණ අතර රපෝර්තු දිනට පවත්නා තාවකාලික වෙනස්කම් මත බදු බැරකම් ක්‍රමවේදය යොදා ගනිමිනි.

### 3.8 අදාළ පාර්ශව ආශ්‍රිත ගනුදෙනු

කිසියම් මිලක් අයකරනු ලබන්නේද, නොලබන්නේද යන කාරණය නොසලකා එක් පාර්ශවයක මූල්‍යමය සහ මෙහෙයුම් ප්‍රතිපත්ති/ තීරණ ඉක්මවා පාලන හැකියාවක් ලබා ගැනීමට හෝ සැලකිය යුතු බලපෑමක් ඇති කිරීමට අනෙක් පාර්ශවයට ඉඩ ලැබෙන ගනුදෙනු සම්බන්ධයෙන් හෙලිදරව් කිරීම් සපයනු ලැබ තිබේ. මූල්‍ය ප්‍රකාශයට කර ඇති අදාළ සටහන්හී ඒ හා සම්බන්ධ තොරතුරු අනාවරණය කර ඇත.

### 3.9 රපෝර්තු කාල පරිච්ඡේදයෙන් පසු උද්ගතවන සිදුවීම්

රපෝර්තු කාල පරිච්ඡේදය අවසානය හා නිකුත් කරනු ලැබීම සඳහා මූල්‍ය ප්‍රකාශ වලට බලය ලබා දෙන අවස්ථාව අතර සිදුවන්නාවූ හිතකර හා හිතකර නොවන සිදුවීම් රපෝර්තු කාල පරිච්ඡේදයෙන් පසු උද්ගත වන්නාවූ සිදුවීම් වන්නේය.

රපෝර්තු කාල පරිච්ඡේදයෙන් පසුව උද්ගත වන සිදුවීම් වල වැදගත්කම සම්බන්ධයෙන් සැලකිල්ල යොමු කෙරෙන අතර අවශ්‍ය අවස්ථාවන්හිදී මූල්‍ය ප්‍රකාශවලට අවශ්‍ය වන්නාවූ ගැළපුම් හෝ ඊට සිදුකළ යුතු සුදුසු හෙළිදරව් කිරීම් සැපයෙනු ඇත.

### 3.10 ඛණ්ඩමය වාර්තාකරණය

ඛණ්ඩයක් යනු අදාළ නිෂ්පාදන හෝ සේවා සැපයීම (ව්‍යාපාරික ඛණ්ඩය) සඳහා හෝ කිසියම් ආර්ථික පරිසරයක් තුළ නිෂ්පාදන හෝ සේවා සැපයීම (භූගෝලීය ඛණ්ඩය) සඳහා එකිනෙකට වෙනස්ව හඳුනාගත හැකි ව්‍යාපාර අංගයකි. ඒවා එම ඛණ්ඩවලින් එකිනෙකට වෙනස් වන්නාවූ අවදානම් හා ප්‍රතිලාභ වලට යටත්ව පවතින්නේය. ඛණ්ඩමය තොරතුරු ඉදිරිපත් කෙරෙනුයේ සංස්ථාවේ ව්‍යාපාරික හා භූගෝලීය ඛණ්ඩවලට අදාළ වන පරිදිය. ඛණ්ඩමය වාර්තාකරණය පිළිබඳ සංස්ථාවේ මූලාකෘතිය පදනම්ව ඇත්තේ ව්‍යාපාරික ඛණ්ඩ මතය.

ව්‍යාපාරික ඛණ්ඩ නිශ්චය කෙරෙනුයේ, සංස්ථාවේ කළමනාකරණය හා අභ්‍යන්තර වාර්තාකරණය පිළිබඳ ව්‍යුහය මත පදනම්වය.ඛණ්ඩ අතර මිල නියම කිරීම් තීරණය වනුයේ අතේ දුරින් පිහිටි පදනමක් මතය. ඛණ්ඩමය ප්‍රතිඵල වලට, වත්කම්වලට හා බැරකම්වලට යම් ඛණ්ඩයකට ඍජුවම හේතුකාරක වන්නාවූ විෂයාංග මෙන්ම යුක්ති සහගත පදනමක් මත වෙන්කර දිය හැකි විෂයාංගද අන්තර්ගත වන්නේය.

සංස්ථාවේ ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාව තුළ ස්ථානගත වී ඇත. ඒ හේතුව නිසා සංස්ථාව ස්වකීය මෙහෙයුම් කටයුතු ඉටුකරන ආර්ථික වාතාවරණය භූගෝලීය පදනමක් මත

සැලකිය යුතු අයුරින් වෙනස් වන්නාවූ අවදානම් හා ලැබුම් දීමනා වලට යටත් නොවේ. එහෙයින් භූගෝලීය වශයෙන් කෙරෙන හෙළිදරව් කිරීම් මෙහිලා නොසැපයේ.

මූල්‍ය ප්‍රකාශයට කර ඇති අදාළ සටහන්හි ඒ හා සම්බන්ධ තොරතුරු අනාවරණය කර ඇත.

## 3.11 මුදල් ප්‍රවාහය

'වක්‍ර ක්‍රමය' භාවිතා කරමින් පිළියෙළ කර ඇති මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා ලත් පොළී හා ලත් ලාභාංශ ආයෝජනමය මුදල් ප්‍රවාහ යටතේ වර්ගීකරණය කරනු ලබන අතර ගෙවූ ලාභාංශ මූල්‍යමය මුදල් ප්‍රවාහ වශයෙනුත්, ගෙවූ පොලී මෙහෙයුම් මුදල් ප්‍රවාහ වශයෙනුත් ඒවා යටතේ වර්ගගත කෙරේ.

### 3.11.1.1 සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන වර්ෂයේ තොරතුරු වඩා ක්‍රමවත්ව හා එකී තොරතුරු හා සංසන්දනාත්මකව ඉදිරිපත් කිරීම අදාළ වන්නාවූ අවස්ථාවන්හිදී ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශවලට අයත් ඉදිරිපත් කිරීම හා වර්ගීකරණය සංශෝධනයට හසුකර ඇත.

### 3.11.1.2 නව ප්‍රමිති සහ මෙතෙක් පිළිපැද නොමැති අර්ථ නිරූපණ

2016 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වූ වසර සඳහා නව ප්‍රමිතීන්, ප්‍රමිති සංශෝධන සහ අර්ථකථන ගණනාවක් තවමත් බලාත්මක නොවන අතර මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී ඒවා අදාළ කර නොමැත. ඊට පහත සඳහන් දෑ ඇතුළත් වේ;

එහිලා 2018 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන පහත දැක්වෙන ප්‍රමිතීන් ඇතුළත් වේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම් වාර්තාකරණ ප්‍රමිති අංක 09 - මෙම ප්‍රමිතිය 2018 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව ඇරඹෙන වාර්ෂික කාල සීමාවන් සඳහා බලාත්මක වේ. ශ්‍රී ලංකා ගිණුම් වාර්තාකරණ ප්‍රමිති අංක 09 සම්මත කිරීම සංස්ථාවේ මූල්‍ය උපකරණ වර්ගීකරණය සහ මානනය කෙරෙහි බලපෑමක් ඇති කරනු ඇත.

